# සංක්ෂේප රූප සඞ්ග්‍රහ වර්ණනාව.

නමො තස්ස භගවතො අරහතො
සම්මා සම්බුද්ධස්ස.

"රුප්පතීති ඛො භික්ඛවෙ තස්මා රූපන්ති වුච්චති" යනු සර්වඥයන්වහන්සේ විසින් සංයුක්තනිකායෙහි වදාළ රූපශබ්දයාගේ විග්‍රහ වාක්‍යයයි.

අථ:-භික්ඛවෙ, මහණෙනි! (යංධම්මජාතං), යම් පෘථිවි ආපස්ආදි ස්වභාව ධර්මයෙක්; ඛො, ඒකාන්තයෙන්; රුප්පති, (ක්ෂණයෙක් ක්ෂණයෙක්හි බිඳී) අතුරුදන්වේද; ඉති,(තස්මා), එසේ (ක්ෂණයෙක් ක්ෂණයෙක්හි බිඳී අතුරුදන්වන) හෙයින්; (තං ධම්ම ජාතං), ඒ (පෘථිවි ආපස්ආදි) ස්වභාව ධර්මයතෙම; රූපන්ති, රූපයයි; වුච්චති, කියනු ලැබේ.

යථොක්ත විග්‍රහවාක්‍යයෙන් යට වා පොළොව පටන් උඩ අකනිටා බඹලොව දක්වා මේ අතර අනන්තලොකධාතූන්හි පරමාණු, අණු, තජ්ජාරි, රථරේණු, ලික්ඛා, ඌකා, ධාන්‍යමාසාදීන්ගේ වශයෙන් නන්වැදෑරුම් රූප ස්වභාව රූප පිඩු බවට පැමිණෙමින් පවතින ස්කන්ධආබන්ධනාදි රූප ධර්ම සියල්ලක් නිතර බිඳෙමින් අතුරුදන්වන සුලුහෙයින් සාමාන්‍යයෙන් රූපයයි වර්ණනාකර වදාරනලදී.

විශෙෂලක්ෂණවශයෙන් වනාහි:-

1. පෘථිවිය, ආපොය, තෙජය, වායොයයි මහා භූත රූප සතරෙක 4.

2. චක්ෂුය, ශ්‍රොත්‍රය, ඝ්‍රාණය, ජිව්හාය, කායයයි ප්‍රසාද රූප පසෙක 5.

3. රූපය, ශබ්දය, ගන්ධය, රසය, ස්පර්ශබ්බයයි ආලම්බන රූපසතෙක 7.

(මෙහි පෘථිවි, තෙජෝ, වායො මහාභූතත්‍රය ඵොට්ඨබ්බාලම්බනයකොට ගත් හෙයින් ඒ වෙනුවෙන් රූප වැඩිවීමක් නැති බව දතයුතු.)

4. ස්ත්‍රීභාවය, පුරුෂභාවයයි භාවරූප දෙකෙක 2.
5. ජීවිත රූප එකෙක 1.
6. හෘදය වස්තු රූප එකෙක 1.
7. ආහාර රූප එකෙක 1 යන අටළොස 18. ඉපදීමයයි කියනලද ජාතිලක්ෂණයෙන් යුක්තවූහෙයින් කර්මයෙන් උපදනාරූප, චිත්තයෙන් උපදනා රූප, ඍතුවෙන් උපදනාරූප, ආහාරයෙන් උපදනා රූපයයි ස්වකීය ස්වකීය ජනකප්‍රත්‍යයන්ගෙන් වෙනස්කොට කියහැකිවේ. එහෙයින්ම ඒ රූප අටළොස 18 නිෂ්පන්නරූපනම්වූහ.
8. පරිච්ඡේද රූප එකෙක 1.
9. කායවිඥප්තිය, වාග්විඥප්ති යයි විඥප්ති රූප දෙකෙක 2.
10. ලඝුතාය, මුදුතාය, කම්මඤ්ඤතායයි විකාරරූප තුනෙක3.
11. උපචයය, සන්තතිය, ජරතාය, අනිච්චතායයි ලක්ෂණ රූප සතරෙක 4. යන දශය 10. ඒ අටළොස් නිෂ්පන්න රූපයන්ගේම අවස්ථාමාත්‍රව කර්මාදිප්‍රත්‍යයන්ගෙන් හටනොගන්නාහෙයින් අනිෂ්පන්න රූපනම්වූහ.

මෙසෙයින් අටළොස් නිෂ්පන්න රූපයන්ගේද දශ අනිෂ්පන්න රූපයන්ගේද වශයෙන් රූපය විශේෂයෙන් අටවිසි වැදෑරුම්යයි දතයුතු.

---

## 1. පෘථිවී රූපය.

ලෝකයෙහි සවිඤ්ඤාණක අවිඤ්ඤාණක් සන්තානයන්හි මහජනයාට ප්‍රකටවී තිබෙන ස්තබ්ධ මෘදු ආකාරක්‍රියාමාත්‍රය පෘථිවී රූප නම්වේ. ඒ පෘථිවී රූපය ස්තබ්ධවූ හෝ මෘදුවූ ක්‍රියා මාත්‍රයමුත් පරමාණු පමණද ද්‍රව්‍යයක් නොවේ. සත්ත්වයෙක් පුද්ගලයෙක් ජීවයක්ද නොවේ. දැනීමක් ඇඳිනීමක් ඇතිව කෙසගක් පමණද පුද්ගලයකුට වසගවන සුළුද නොවේ.

පුද්ගලයාතුල මෘදු ලක්ෂණයට පමුණුවා ගනු කැමැත්ත තිබියදීත් ස්තබ්ධ ලක්ෂණයට හිතවූ ප්‍රත්‍යය සාමග්‍රියක් එළඹ සිටිය හොත් පෘථිවී රූපය ස්තබ්ධභාවයටම පෙරළෙන සුළුය. පුද්ගලයාගේ ස්තබ්ධ භාවයට පමුණුවාගනු කැමැත්ත තිබියදීත් මෘදුභාවයට හිතවූ ප්‍රත්‍යය සාමග්‍රියක් එළඹ සිටියහොත් පෘථිවීරූපය මෘදුභාවයටම පෙරළෙන සුළුය. එහෙයින් මේ පෘථිවී රූපය ධර්මනාමයෙන්ද ධාතු නාමයෙන් ද වදාරනලදී.

ලෞකික මහාජනයාට පෘථිවි රූපය සම්බන්‍ධව ඝනබද්ධ මෘදුලක්‍ෂණයන් ගැනදැනීමක් ඇතත් ඒ වෙනම ධාතුමාත්‍රයක කියා පිරිසිදු දැනීමක් නැත්තේය. එහෙයින් ලෞකික මහාජනයාතුළ සවකීය ස්කන්‍ධයෙහි ඝනබද්ධවූද මෘදුවූද පෘථිවි ධාතුව කෙරෙහි මමය මාගේයයි ආත්ම ආත්මීය දෘෂ්ටි ග්‍රාහය ඇතිවී තිබේ. ආපො, තෙජෝආදි රූපද මේ පෘථිවි රූපයම නිඃශ්‍රයකොට ගෙන පහළවන රූපයන් බව දතයුතු

පෘථිවිරූප දහස් ගණන් ලක්‍ෂ ගණන් එකතුවී පරමාණු, අණු, තජ්ජාරි, රථරේණු ආදි සංස්ථාන ප්‍රඥප්ති භාවයට පැමිණි සන්තානානුබද්ධව ඇතිව නැතිවෙමින් පවත්නා බවද ස්වල්ප පෘථිවිධාතු මාත්‍රයක්වීනම් සටහන් බවට පැමිණ ගත නොහී ක්‍ෂණයකින්ම අතුරුදහන් වියහැකි බවද දතයුතු.

---

## ආපො රූපය.

ලොකයෙහි සවිඥනක අවිඥනක සංස්ථානව පෙනී සන රූප පිඩුවල මහාජනයාට ප්‍රකටවී තිබෙන ආබන්‍ධන පග්‍ඝරණාකාරක්‍රියාමාත්‍රය ආපොරූප නම්වේ. ඒ ආපොරූපයද ආබන්‍ධන ලක්‍ෂණ හෝ පග්‍ඝරණ ලක්‍ෂණවූ ක්‍රියා මාත්‍රයමුත් පරමාණු පමණද ද්‍රව්‍යයක් නොවේ. සත්ත්වයෙක් පුද්ගලයෙක් ජීවයෙක්ද නොවේ. දැනීමක් ඇඳිනීමක් ඇතිව කෙසගක් පමණද පුද්ගලයකුට වසගවන සුලුද නොවේ.

පෘථිවි තෙජෝ ආදි සෙසු රූප එකට බැඳී පරමාණු, අණු, තජ්ජාරි, රථ රේණුන්ගේ පටන් පෘථිවි පර්‍වත ආදි විශාල වස්තූන්දක්වා නොයෙක් ආකාරයෙන්කුඩුමහත් සටහන්ව පෙනීයන්නේ මේ ආපො රූපයාගේ ආබන්‍ධන කෘත්‍යයේ බල යෙනි. ලොකයෙහි ආපොරූපය ස්ම්පූර්‍ණයෙන් නිරුද්ධවූව හොත් පරමාණු පමණද රූප සටහනක් රූපපිඩක් ඇතිවිය හැකි නොවේ.

---

## තෙජො රූපය.

ලොකයෙහි සවිඥනක අවිඥනක සන්තානයන්හි මහජනයාට ප්‍රකටවී තිබෙන සිහිල් උණුසුම් ආකාරක්‍රියා මාත්‍රය තෙජෝරූප නම්වේ. ඒ තෙජො රූපයද සිහිල් ලක්‍ෂණ උණුසුම් ලක්‍ෂණ ක්‍රියා මාත්‍රයමුත් පරමාණු පමණද ද්‍රව්‍යයක් නොවේ. සත්ත්වයෙක් පුද්ගලයෙක් ජීවයෙක්ද නොවේ. දැනීමක් ඇඳිනීමක් ඇතිව කෙසගක් පමණද පුද්ගලයකුට වසගවන සුලුද නොවේ.

කිකිළිබිත්තරයෙහි සාරස (මදය) මවූ කිකිළි විසින් ස්වකීය ශරීර උෂ්ණයෙන් උණුසුම් ගන්වමින් රක්ක කල්හිම මුහුකුරා අත්තාවූ කකුල් ආදි අඟපසඟ සෑදී පැටවා බවට පැමිණෙන්නේය. ඉදින් මවූ කිකිළි විසින් උණුසුම් ගන්වා නොරකිනා ලද්දේවීනම් ඒ සාරස කුණුවීයන්නේය.. එපරිද්දෙන් පෘථිවී ආපො ආදි රූපද තෙජො රූපයෙන් උණුසුම් ගන්වා රක්ක කල්හිම සනබ්ධ ආබන්ධනාදී ඒ ඒ ලක්ෂණයෙන් මුහුකුරා ශක්ති සම්පන්නාව ප්‍රතිග්‍රහණ උපබෲහනාදි ස්වකීය ස්වකීය කෘත්‍යසම්පාදනයෙහි සමර්ථවන්නාහුය. පෘථිවි රූපය ප්‍රතිග්‍රහණ කෘත්‍යයෙහි සනබ්ධ ලක්ෂණයෙන් මුහුකුරා ශක්තිසම්පන්නාවන්නේත් ආපො රූපය උපබෲහන කෘත්‍යයෙහි ආබන්ධන ලක්ෂණයෙන් මුහුකුරා ශක්ති සම්පන්නාවන්නේත් වායො රූපය සමුදීරණ කෘත්‍යයෙහි විසතම්භන ලක්ෂණයෙන් මුහුකුරා ශක්තිසම්පන්නා වන්නේත් මේ තෙජො රූපයාගේ උණුසුම්ගන්වා ආරක්ෂා කිරීමේබලයෙන්මය. එහෙයින් මේ තෙජො රූපයඅන්‍ය රූපයන්ගේ මාතෘ රූපයද වෙයි. පිතෘ රූපයද ගුරුවර රූපයද රාජරූපයද වෙයි.

තෙජො රූපය කෙසේනම් අන්‍යරූපයන්ගේ මාතෘ රූපය වන්නේද? යත්. ලොකයෙහි පුත්‍ර දුහිතෘන් මවුගෙන් හට ගෙන මවුගේ පොෂණයෙන් දියුණුවන්නාක්මෙන් පෘථිවි ආපොආදි රූපද තෙජො රූපයෙන් හටගෙන තෙජො රූපයාගේ පොෂණයෙන්ම දියුණුවන්නාහුය. මේ කියන ලද්දේ තෙජො රූපය අන්‍යරූපයන්ගේ මාතෘ රූපය වන අන්දමයි.

තෙජො රූපය කෙසේනම් අන්‍ය රූපයන්ගේ පිතෘ රූපය වන්නේද යත්?. පුත්‍ර දුහිතෘන් පියාගෙන් ලබනලද සඞ්ග්‍රහ ඇතිව දියුණුවන්නාක්මෙන් පෘථිවි ආපො ආදි රූපද තෙජො රූපයෙන් උණු සිසිල් ගැන්වීම් ආදීයෙන් ලබනලද සඞ්ග්‍රහ ඇතිවම දියුණුවන්නාහුය. මේ කියන ලද්දේ තෙජො රූපය අන්‍යරූපයන්ගේ පිතෘ රූපය වන අන්දමයි.

තෙජො රූපය කෙසේ නම් අන්‍ය රූපයන්ගේ ගුරුවර රූපය වන්නේද?යත් ගුරුවරයා නොහික්මුණු ශිෂ්‍යයන් හික්මුණු ශිෂ්‍යයන්කොට නූගත් ශිෂ්‍යයන් උගත් ශිෂ්‍යයන් කොට නොදමුණු ශිෂ්‍යයන් දමුණු ශිෂ්‍යයන්කොට හික්මවන්නාක්මෙන් තෙජොරූපයද අකර්මණ්‍ය රූපයන් කර්මණ්‍ය රූපයන්කොට නොදමුණු රූපයන් දමුණුරූපයන්කොට නොමට නොසිලිටු රූපයන් මට සිලුටු රූපයන්කොට නොමුහුකළ රූපයන් මුහුකළ රූපයන්කොට නොදැඩි රූපයන්

දැඩි රූපයන්කොට නොතියුණු රූපයන් තියුණු රූපයන් කොට හික්මවන්නේය. මේ කියනලද්දේ තේජෝ රූපය අන්‍ය රූපයන්ගේ ගුරුවර රූපය වන අනුමයි.

තෙජෝ රූපය කෙසේනම් අන්‍ය රූපයන්ගේ රාජරූපය වන්නේද? යත්. රජහු රටුන්ට සඞ්ග්‍රහකළ යුතු අවසථාව පැමිණි විට වසතු දීම් තනතුරු දීම් ආදියෙන් සඞ්ග්‍රහද දඬුවම් පැමිණවිය යුතු අවසථාව පැමිණි විට දඩමුඩ පැමිණවීම් හිර අඩස්සියේ තැබීම් අත්පා කැපීම් ආදියෙන් දඬුවම්ද කරන්නේය. එමෙන් තෙජෝ රූපයද සවිඥානක අවිඥානක සන්තානයන්හි අන්‍යරූපයන් ක්‍ෂණයෙක් ක්‍ෂණයෙක්හි උණුසුම්ගන්වා නවමින් දියුණුද කරයි ක්‍ෂණයෙක් ක්‍ෂණයෙක්හි අන්‍යරූපයන් දවමින් නටබුන්ද කරයි. මේ කියන ලද්දේ තෙජෝ රූපය අන්‍යරූපයන්ගේ රාජ රූපය වන අනුමයි.

ලෞකික ධාතු ශාසත්‍රඥයෝද රසදිය ලෝහ ආදී සාරධාතු වගී කලිෂට ඖදාරික ගති පහකොට ශුබ කරගනු කැමැත්ත ඇතිවූ කල්හි මූල භෙෂජ්‍යාදින් සමග සංයොගකොට මේ තෙජෝ රූපය ලවා ඒ කලිෂට ඖදාරික ගති පහකොට ඒ රස දිය ලෝහ ආදී සාර ධාතු වගී ශුබ කරගන්නාහුය. එහෙසින් රසදිය ලෝහ ආදී ධාතූන්ගේ කලිෂට ඖදාරික ගති පහකොට ශුබ කරන්නාද මේ තෙජෝ රූපය මැයි.

සත්ත්වශරීරයෙහිද මේ තෙජෝ රූපයාගේ ලක්‍ෂණ තේ රුම්ගෙන ඊට ගැලපෙන පරද්දෙන් කෑම් බීම් ඉඳුම් හිටුම් ආදිය පවත්වත්නම් දීඝායුෂ්කතාදී ඵල භුක්ති විඳිය හැකිවේ. අනමතග්‍ර සංසාරය මුළුද, චක්‍රවාල පෘථිවි පර්‍වත සාගර චන්ද්‍ර සූය්‍ය නක්‍ෂත්‍ර තාරකාදී කාලෙපාපකරණ මවා දියුණු කළ මැවුම්කාරයාද මේ තෙජෝ රූපය මැයි ඒවා විනාශ කළ කතීද මේ තෙජෝ රූපයමැයි.

---

## වායො රූපය.

ලොහො ගුලිලොහොදිය ගිනි අඟුරු ආදී උෂ්ණවස්තූන්හි උෂ්ණවෙගයක්ද අයිස් පිනි ආදී සිසිල් වස්තූන්හි සිසිල් වෙගයක්ද විද්‍යමානයි. ඒ වෙගය ලොහොගුලි ලොහොදිය ගිනි අඟුරු අයිස් පිනි ආදී වස්තූන්හි පමණක් නොව සියලුම වස්තූන්හි ඒ ඒ වස්තූන්ගේ ප්‍රමාණයේසැටියට විද්‍යමානමය.

ඒ වෙගය වායො රූපයයි කියනලදි. මෙසේකියනලදනයින් තෙජොරූපයෙහි වෙගයක් විද්‍යමානනම් පෘථිවි ආපො රූපයන්හිද ඒ වෙගය විද්‍යමාන වියයුතු.

එහෙයින් පෘථිවි ආපස් තෙජස් සඞ්ඛ්‍යාත ත්‍රිවිධරූපයන්හිම විද්‍යමානවූ ඒ උෂ්ණ සිසිල් වෙගය වායො රූපයයිදතයුතු.

ඇල, දොල, ගං, හෝ ආදියෙහි ජලස්‍යන්දනයද රළුවෙගයද ඒ වායො රූපයාගේම කෘත්‍යයකි. ආපො රූපය ඉතා බරරූපයක් බැවින් ඇල දොල ගංහෝ ආදියෙහි ජලයෙහි ආබන්ධන කෘත්‍යයෙන් බැඳගැනීමට තරම් ඝනබද්ධ ලක්ෂණ පෘථිවියක් නැතිව ඒ ජලය මිටි තැන් කරා බැසයාම ධර්මතාවවීතිබේ. වායො රූපයාගේ විජෘම්භණයට ස්ථානයනම් ආකාශ කුහරයයි. ජලයෙහි ගලායාමද ඒ ජලාභ්‍යන්තරයෙහි පහළවන තෙජො රූප වෙගයවූ සුළඟින් තල්ලුකරන ලදින් අභිනව අභිනව ආපොඋත්සන්න රූප කලාප දෙශාන්තරොත්පත්ති වශයෙන් ඉපදී ඉපදී තල්ලුවීයාමයි. ඒ එසේමය. ආපොරූපයෙන් තල්ලුකරනලද වායොරූපය පිටවීමට දැගලීමෙන් ආපොරූපයත් සමගම පහතට බරවියන්නේය. එසේ බරවීයාමෙන් ඇල දොල ගංහෝ ආදියෙහි ජලස්‍යන්දනය වන බව දතයුතු. එහෙත් ආපො රූපයට වායො රූපයාගේ අභ්‍යන්තරයෙහිමුත් පෘථිවි රූපයාගේ අභ්‍යන්තරයෙහි විජෘම්භණයට අවකාශයක් නැත්තේය. සමහර ආචාර්‍ය්‍ය කෙනෙක් පෘථිවි රූපය වායො රූපයටද තෙජො රූපය ආපො රූපයටද විරුද්ධයයි කියත් ඒ විරුද්ධයද පෘථිවි තෙජො ආදි ඒ ඒ රූපඋත්සන්නකොට්ඨාසයන්හිම ඇතිවන වෙනසකි. එහෙත් පෘථිවි, ආපො, තෙජො, යන ත්‍රිවිධ රූපම වායො රූපය බලකොටගෙන තම තමන් අයත් කිස ඉටු කිරීමෙහි පොහොසත් වන්නෝය.

ලොකයෙහි වායො රූපය අතුරුදන්වීනම් පෘථිවි, ආපො, තෙජො රූපද බලසුන්ව ක්ෂණයකින් අතුරුදන්වන්නාහුය. සත්ත්වයාසම්බන්ධ ඒ ඒ ශරීරාඞ්ගයන්ගේ සැලීමද අඞ්ගමඞ්ගානුසාරී චිත්තජ වායො රූපයාගේම කෘත්‍යයකි. යම් වේලාවක යම් ශරීරාඞ්ගයක් සලනු කැමැතිවීනම් ඒ වේලාවෙහි ඒ ශරීරාඞ්ගය සැලීමට තරම් උත්සාහවත්වූ ජවනචිත්තවීථි උපදිමින් පහළකුරනු ලබන වායො රූපයෙන් ඒ ශරීරාඞ්ගයට වැටී තිබෙන නහරකුහර ක්ෂණයකින් පරිපූර්ණවෙයි. විදුලි පණිවුඩ යැවීමේදී "කොළඹ" විදුලි කන්තෝරුවේ සවිකර තිබෙන විදුලි යන්ත්‍රයේ ඇණයට ඇඟිල්ලෙන් තට්ටු කළ

කල්හි “ගාල්ල, මහනුවර, කල්කටා, එංගලන්තාදී” නගර දක්වා ඇද තිබෙන විදුලි කම්බි ක්ෂණයකින් වායො රූප යෙන් පිරීයන්නාක් මෙනි. විදුලි යන්ත්‍රයේ ඇණයට ඇඟිල් ලෙන් තට්ටු කිරීම් ව්‍යාපාර වේගය සමගම එහි නැග සිටි වායො රූප පරම්පරාව නිරුද්ධවන්නාක්මෙන් ඒ ඒ ශරීරාංග සැලීමෙහි පොහොසත්වූ වායො රූප නැගිටවූ චිත්ත විපීත් සමග ඒ ඒ ශරීරාංගයන්හි නැගී සිටි අංගමංගානුසාරී චිත්තජ වායො රූපද ක්ෂණයකින් නිරුද්ධවන්නාහුය.

මෙසේ වන වෙනස සාමාන්‍ය මනුෂ්‍යයෝද දනිත්මුත් ඒ පූරාණ චිත්තජ රූපයන්ගේ නිරොධයෙන් වන අභිනව චිත්තජ රූපයන්ගේ පහළවීමක කියා පිරිසිඳ නොදනිත්.

ඒ අංගමංගානුසාරීවායො රූපයාගේ කෘත්‍යයවූ අධ්‍යාත්මික රූපයන්ගේ සැලීම දක ඒ රූප සත්ත්වයෙක පුද්ගලයෙක යනාදීන් වරදවා ගැනීමද මේ සත්ත්වයන්ට ඇතිවී තිබෙන් නේ ඒ වායො ධාතු කෘත්‍යයාගේම ආනුභාවයෙනි.

---

## 2. ප්‍රසාද රූප පස.

චක්ෂුඃප්‍රසාද රූපය ඇස්තරුව තුළද ශ්‍රොත ප්‍රසාද රූපය කන්සිදුරතුළද ඝ්‍රාණප්‍රසාද රූපය නැහැ සිදුරතුළද ජිහ්වා ප්‍රසාද රූපය දිවමැදද කායප්‍රසාද රූපය සකල ශරීරය සිසාරා සෑම තැනමද පිහිටා තිබේ. මේ රූපපඤ්චකය කර්මජ මහාභූතයන්ගේ කාන්තියව ප්‍රසාද රූපනම්වේ. පාලියෙහි “පසාද, පසන්න, අච්ඡ, මණ්ඩ” යන නම් සතරින් ඒ කාන්තිය ප්‍රකාශිතයි. දූව ලොහො ආදියෙන් භාණ්ඩ වගී සාදා මට සිලූටුකොට මැද්ද කල්හි ඒ භාණ්ඩ වගීවල සහ බොරගතිය පහව පැහැදුණු ජල තෙල් රසදිය ආදී වස්තු වගී වල ඉදිරි යෙහි සිටින්නවුන්ගේ ඡායාව වැටෙන තරමට දිලෙන කාන්තියමෙන් සත්ත්වශරීරයෙහි කර්මජපෘථිවිධාතු ආපො ධාතුන්හිද කාන්තියක් ඇත්තිය. ඒ කාන්තිය ප්‍රසාද රූපයයි කියන ලදී.

නැවත නැවත පිහිරා දළුගති අවුල්ගති පහකොට පිරිසිඳු කරගන්නාලද කපු පුළුන් සෑහෙන තරමකටගෙන නැවත නැවත උණුකොට බොර ගතියපහකොටපිරිසිඳු කරගන්නා ලද තලතෙලේ දමා සියලු අවයව සම්පූර්ණකොට මැටියෙන් හෝ දැවයෙන් ඉදි කරනලද රූපයක මට සිලුටු ආකාරයෙන් ඒ කපු පුළුන් ආලෙපකර බලනු. කපු පුළුන් කාන්තිමත්ව

දිලියෙනාකාරයෙන් පෙනී යනවා ඇත. මේ ශරීරයෙහි කර්මජ පෘථිවි ආපො රූප දෙවර්ගය මේ උපමාවෙහි කී කපු පුළුන් හා සදෘශයි. පඤ්චප්‍රසාද රූප එහිවූ කාන්තිය හා සදෘශයි. ඒ ප්‍රසාද රූප පඤ්චකයද චක්ෂුර්විඥෙය නොවේ හුදෙක් වර්ණ ශබ්ද ගන්ධ රස ප්‍රෂ්ටව්‍යයන පඤ්චාලම්බනච්ඡායාවක් වැටෙන තරමට දිලෙන කාන්ති පඤ්චකයක් බැවින් මනොවිඥෙයමවේ.

මනුෂ්‍ය ගො මහිෂ පෘථිවි පර්වත චන්ද්‍ර සූර්‍ය්‍ය නක්ෂත්‍ර තාරකාදිවූද ගෘහ විමාන වස්ත්‍රාභරණාදිවූද ගිනිරැස් ඉරුරැස් සඳරැස් තරුරැස් මිණිරැස් ආදිවූද ප්‍රාණය ඇති නැති ද්‍රව්‍ය සටහන් ද්‍රව්‍ය අරමුණු සෙව නැලි වර්ග සියල්ලක් චක්ෂුඃ ප්‍රසාදයෙහි ඝට්ටණයට පැමිණෙන්නේය. ඒ ඝට්ටණයද හෙන පහරක් සේ අතිශයින් බලවතරවේ. එහෙයින් ඒ ඝට්ටණයෙන් ඇතිවන ජවන් සිත් අනුරාවය බොහෝ වේලාවක් සන්තතිය නොසිඳ පවතින්නේය. එකපහරක් ඝණ්ටාදිවවැදීමෙන් ඇතිවන්නාවූ ඝණ්ටා අනුරාවය බොහො වේලාවක් සන්තතිය නොසිඳ පවත්නාක් මෙනි. ආලම්බන ඝට්ටණ වෙගය දුර්වල නම් ජවන් සිත් ගණන ස්වල්පවේ. දක්කා නොදක්කා මෙනැයි කියයුතු තරමට ස්වල්පවේ. එසේ ඇතිවන දැකීමද ආලම්බනච්ඡායාවන්ගේ ප්‍රසාදඝට්ටණයෙන් වන කම්පාවක් මෙන් ජවනොත්පත්ති මාත්‍රයක කියා පිරිසිඳ දැනීමක් නැති හෙයින් මේ සත්ත්වයන්ට "මමදක්නෙමි" යන වැරදි වැටහීම ඇතිවි තිබේ. ඝණ්ඨා ප්‍රහාර වේගය සමගම ශබ්ද රූප අනුරාවය නිරුද්ධවන්නාක්මෙන් ආලම්බනයන්ගේ ප්‍රසාද ඝට්ටණවෙගය සංසිඳීම සමගම තත්සමුත්ථිත විඥාන චිත්ත ජවන චිත්ත සන්තතිහුද නිරුද්ධව සංසිඳියන්නාහුවෙත්.

ශ්‍රොත්‍රප්‍රසාදයෙහි මිනිස් තිරිසන් දිය සුළං හෙන ශබ්දාදි ශබ්ද සෙවනැලිද ඝ්‍රාණප්‍රසාදයෙහි නානාවිධ ඉෂ්ටානිෂ්ට ගන්ධ සෙවනැලිද ජිහ්වා ප්‍රසාදයෙහි නානාවිධ ලොණම්බිලාදි රස සෙවනැලිද කායප්‍රසාදයෙහි නානාවිධ තද මොළොක් පෘථිවි ශීත උෂ්ණ තෙජො විස්තම්භන සමීරණ වායො සඞ්ඛ්‍යාත ත්‍රිවිධ ප්‍රෂ්ටව්‍ය සෙවනැලිද ඝට්ටණය වන්නාහුය.

මේ සතරෙහිද ආලම්බන ඝට්ටණාකාරය චක්ෂුඃ ප්‍රසාදයෙහි කී නයින් දතයුතු. චිත්තසන්තතිද ශබ්දාලම්බනය ශ්‍රවණය කරන චිත්තසන්තතිය, ගන්ධාලම්බනය ආඝ්‍රාණය කරන චිත්තසන්තතිය, රසාලම්බනය ආස්වාද කරන චිත්ත සන්තතිය, ප්‍රෂ්ටව්‍යාලම්බනය ස්පර්ශකරන චිත්තසන්තතිය කියා

2018 05 15 Paññápárami - Na Uyana Free Distribution



බෙදා ගතයුතු. ඝණ්ටාප්‍රහාරොපමාවද වාරයක් පාසාම යොදාගත යුතු. සාමාන්‍ය මනුෂ්‍යයෝ මේ ප්‍රසාද පඤ්චකයද තදාශ්‍රයෙන් උපදින විඥානපඤ්චකයද ඇසට පෙනෙන්නේය, කනට ඇසෙන්නේය, නැහැයට ගඳ සුවඳ දැනෙන්නේය, දිවට රස දැනෙන්නේය, ශරීරයට ස්පර්ශ දැනෙන්නේයයි ගන්නා පමණමුත් වෙනම උපදින ධාතූන්යයි පිරිසිඳ නොදනිත්. එසේ පිරිසිඳ නොදන්නා හෙයින්ම චක්ෂුඃප්‍රසාදය මමයයි ගෙන මම දක්නෙමියි චක්ෂුඃප්‍රසාදයෙහි ආත්මදෘෂ්ටික වන්නාහුය. ශ්‍රොත්‍රප්‍රසාදය මමයයි ගෙන මම ශ්‍රවණයකරමියි ශ්‍රොත්‍රප්‍රසාදයෙහි ආත්මදෘෂ්ටික වන්නාහුය. ඝ්‍රාණප්‍රසාදය මමයයි ගෙන මම ආඝ්‍රාණය කරමියි. ඝ්‍රාණප්‍රසාදයෙහි ආත්මදෘෂ්ටික වන්නාහුය. ජිව්හාප්‍රසාදය මමයයි ගෙන මම රස දනිමියි ජිව්හාප්‍රසාදයෙහි ආත්ම දෘෂ්ටික වන්නාහුය. කායප්‍රසාදය මමයයිගෙන මම ස්පර්ශදනිමියි කායප්‍රසාදයෙහි ආත්ම දෘෂ්ටික වන්නාහුය. එසේ ගෙන ආත්මදෘෂ්ටිකයන් වන නමුත් මේ පඤ්චප්‍රසාදයන්හිද පුද්ගලයකු සත්ත්වයකු ජීවයකු ස්වාමියකු කියා නැත්තේය. දැනීමකු ඇඳිනීමකු කියාද නැත්තේය. හුදෙක් මේ පඤ්චප්‍රසාදද නිස්සත්ත්ව නිර්ජීව අව්‍යාකෘත ධාතු මාත්‍රයෝමය.

---

## 3. අරමුණුරූ සත.

වර්ණය, ශබ්දය, ගන්ධය, රසය, ප්‍රෂ්ටව්‍යය යන 7 සත අරමුණුරූපයයි කියන ලදහ. (ප්‍රෂ්ටව්‍යාලම්බනය පෘථිවිය තෙජොය වායොයයි තෙවැදෑරුම්වන හෙයින් අරමුණුරූප සතයයි කියන ලදහ) ඔවුන් අතුරෙන් වර්ණය චක්ෂුඃ ප්‍රසාදයෙහිද ශබ්දය ශ්‍රොත්‍රප්‍රසාදයෙහිද ගන්ධය ඝ්‍රාණප්‍රසාදයෙහිද රසයජිහ්වා ප්‍රසාදයෙහිද ප්‍රෂ්ටව්‍යය කාය ප්‍රසාදයෙහිද වැදගන්නේය. ඝට්ටණයවන්නේයි සේයි. ආපො රූපය ආපොඋත්සන්න ජලයට බැසදස්පර්ශකරවා ගතහැකි රූපයක් නොවේ. එහෙයින් ප්‍රෂ්ටව්‍යාලම්බනයෙහිලා නොවදැරනලදී. ජලය ආපොඋත්සන්න කොට්ඨාසයකි එහෙයින් එහි පෘථිවි රූපකැටිව ඝන බද්ධ භාවයට පැමිණගත නොහෙන්නෝයහ. මනුෂ්‍යයෝ ජලය ස්නානාදි කාලවල ශරීරයෙහි ස්පර්ශවන්නේයයි හඟිත්මුත් එහි ඝට්ටණ ලක්ෂණය පෘථිවි ස්පර්ශය මුත් ආපො ස්පර්ශයක් නොවේ. උණු සිසිල් ස්පර්ශයද තෙජො ස්පර්ශය මුත් ආපො ස්පර්ශයක් නොවේ. ජලයට බැස පරීක්ෂා කාරීව සිටිනහොත් ශරීරයට තල්ලු වන ආකාරදැනීමක් ඇතිවේ.

2018 05 15 Paññápárami - Na Uyana Free Distribution



ඒ තල්ලු වන ආකාරයද වායො ස්පර්ශය මුත් ආපො ස්පර්ශයක් නොවේමය. එහෙයින් ආපො රූපය හැර ඉතිරි පෘථිවි, තෙජො, වායො යන රූපත්‍රයම ප්‍රෂ්ටව්‍යාලම්බනයකොට වදාරන ලදී.

මෙසෙයින් වර්ණය, ශබ්දය, ගන්ධය, රසය පෘථිවි තෙජෝ වායො ප්‍රෂ්ටව්‍යත්‍රයයයි අරමුණු රූප සතෙක. ගොචර රූප යනුද මීටම නම්වේ. මේ සප්තවිධ ආරම්මණ රූපයන් කෙරෙහි මේ සත්වයෝ දරුණු තියුණු අතිශය බලවත්තර තෘෂ්ණා ආලයකින් බැඳී ගෙනී වාසය කරන්නාහුය. මේ සප්තවිධ ආරම්මණ රූපයන් කෙරෙන් වෙන්වූ කල සත්වයන්ගේ සිත අසරණ වෙයි දිළිඳු වෙයි මලානිකවෙයි. රූප කාම ගුණය, ශබ්ද කාම ගුණය, ගන්ධ කාම ගුණය, රස කාම ගුණය, ප්‍රෂ්ටව්‍ය කාමගුණයයි කියනු ලබනේත් මේ ආරම්මණ රූප සප්තකයයි. මේ ආරම්මර රූප 7 සත ප්‍රසාද රූප 5 පස හා පිඩුකරනු. රූප 12 දොළොසෙක. ඒ 12 දොළොස සත්වයන්ට ප්‍රකට බැවින් ඖදාරික රූපයයි වදාරන ලදහ. ආපො රූපය ආබන්ධන කෘත්‍යයෙන් ප්‍රකටවූවද පඤ්චෙන්ද්‍රිය යන්ට විෂය වන රූපයක් නොවේ. ශුද්ධ මනො විඥානයටම විෂය වන රූපයකි. එහෙයින් ආපො රූපය සූක්ෂම රූපයන්හි ලා වදාරනලදී මෙතෙකින් ආපො රූපය සමග ඖදාරික රූප 12 දොළොස කියා නිමවන ලදහ.

---

## 4. ස්ත්‍රී පුරුෂ භාව රූප දෙක.

ගැනු බව ස්ත්‍රීභාව රූපයයිද පිරිමි බව පුරුෂභාව රූපය යිද කියන ලදී. පෘථිවි රස ආපො රස බීජ යන ත්‍රිවිධ ධාතූන් ගේ අභිසංස්කාරණයෙන් ලොකයෙහි වෘක්ෂ ලතා පහළව දියුණුවීමෙහි බීජධාතුවට අයත්වන්නේ පළමුකොට අඞ්කුරය ඉපදවීම පමණයි. අඞ්කුරය ඉපදී මුල් ඇදගත් පසු බීජය දිරා අතුරුදන්වෙයි. එතැන් පටන් පෘථිවි ආපො රස ධාතූහුම එය දියුණු කරමින් වෘක්ෂලතා භාවයට පමුණුවා අවුරුදු සියදහස් ගණන් මුළුල්ලෙහි පවත්වාගෙනයන්නාහුය. අඞ්කුරය ඇදගත් පසු දියුණුව පෘථිවි රස ආපො රස ධාතූන් ටම අයත්වේ. බීජනියාම ධාතුවට අනුගතවීම වනාහි වෘක්ෂ ලතා දිරා අතුරුදන්වනතුරුද අත් නොහරීමය. එහෙත් ඒ පෘථිවි රස ආපො රස ධාතූන්ට වෘක්ෂලතාවන්ගේ දියුණුව මුත් සංස්ථාන අභිසංස්කරණය කළ හැකි නොවේ.

ඒ ඒ වෘක්ෂලතාවන්ගේ අඞ්කුර, මුල්, පොතු, එලේ, අරටු
අතු, රිකිළි, කොළ, මල්, ගෙඩි සටහන් සමග වර්ණ ගන්ධ රසා
දියද එක් වර්ගයකට එකාවර්ගයක් වෙනස්ව ඇතිවන්නේ බීජ
නියාම බලයෙනි බීජ නියාම ආඥාවෙනි. අඹ බීජයෙන්
හට ගන්නා අඹ වෘක්ෂය බීජය දිරා අතුරු දන්වූ පසුද අවුරුදු
සියදහස් ගණන් මුළුල්ලෙහි වැවෙමින් පවත්නා නමුදු අඹ
සටහන අඹ ආකාරය අත් නොහරීමය. වැරදීවත් අඹ
ආකාරයෙන් අඹ සටහනින් එක කොළයක් එක ගෙඩියක්
එක මලක් පමණද ඇති නොකෙරේමය. වෘක්ෂ ලතා සම්බ
න්ධ දීර්ඝමන්‍දූශ්‍යතාවද මේ බීජනියාම බලයෙන්ම සිඬවන
බව දත යුතු. මෙසෙයින් බීජ ධාතුන්ගේ ආඥාචක්‍රයේ විශාල
තාවය ලෙච්හි අතිශයින් ප්‍රකටය.

සත්ත්වයන්ගේ ප්‍රතිසන්ධි කාලයෙහි මවු පිය දෙදෙනාගෙන්
ඇතිවන ශුක්‍ර ශෝණිත ජනම නියාම ධාතුබලය ජනම්නියාම
ධාතු ආඥාවද මේ වෘක්ෂ ලතාවන්ගේ බීජනියාම බලය බීජ
නියාම ධාතු ආඥාව හා සදෘශවේ. ඒ එසේමය මවු පිය
දෙදෙනාගෙන් ඇතිවන ශුක්‍ර ශෝණිත ජනම නියාම ධාතු
බලයට ජනම නියාම ධාතු ආඥාවට යටත්වම පුත්‍ර දුහිතෘන්
ගේ ශීර්ෂ, හස්ත, පාද, හෘදය, සම්, මස්, නහර, ඇට, හොඬු,
නගුටු, කරමල්, ලොම්, පියාපත්ආදි ශරීරාඞ්ග සංස්ථාන සහ
කළු,නිල්,කහ,රතු ආදී වර්ණ ධාතුද ඡන්‍ද,වීර්‍ය්‍ය,චිත්ත,චෙතනා
දි අරූපී ධර්මද ඇති වන බවප්‍රත්‍යක්ෂය. පුත්‍ර දුහිතෘන්ගේ
මරණයදක්වා පවත්නා ඒ වර්ණසංස්ථානාදිය සහ ඡන්‍ද වීර්‍ය්‍ය
දි ගුණ ගති මවුපිය දෙදෙනාගෙන් මුහුවූ ශුක්‍ර ශෝණිත බීජ
නියාම ආඥාවට කීකරුවමුත් අකීකරුව ඇති නොවන්නාහුම
ය. එහෙයින් සත්ත්වයන්සම්බන්ධ ශුක්‍ර ශෝණිත ජනම නියාම
ධාතුන්ගේ ආඥාචක්‍රයේ විශාලතාවද ලෙච්හි ප්‍රකටය.

මෙසේ වෘක්ෂලතාවන් පිළිබඳවූද සත්ත්වයන් පිළිබඳවූද
බීජනියාම ජනම නියාම ධාතූන් මෙන් සත්ත්වයා පිළිබඳවූ
ගැහැනු පිරිමි සටහන් සංස්කරණය කරන්නාවූ භාවරූප
ඵය ප්‍රතිසන්ධික්ෂණයෙහිම ඇතිවී ස්ත්‍රීසන්තාන පුරුෂසන්තාන
වයෙහි චතුජ රූපසන්තතීන් ආණ්ඩු මට්ටු කරගෙන යන ආ
කාරය දතයුතු. ඒ ස්ත්‍රී පුරුෂ සන්තානවයෙහි ඇතිවනතාක්
රූප ඒ භාව රූපයන්ගේ ආඥා බලයට යටත්වම ඇතිවන්නාහු
ය. ස්ත්‍රී පුරුෂ සන්තානවය දියුණු කරන්නෝ නම් කර්ම
චිත්ත සෘතු ආහාර යන චතුර්විධ ප්‍රත්‍යයෝයි. භාවරූපයන්ට
ස්ත්‍රී පුරුෂසංස්ථාන සංස්කරණයමුත් ස්ත්‍රීපුරුෂ සංස්ථානයන්

පොෂ්‍යයකොට දියුණු කිරීමෙහි පොහොසත්කමක් නැත්තේය. ප්‍රතිසන්ධි ක්ෂණයෙහි ජනක කර්මය විසින් ස්ත්‍රී පුරුෂ සංස්ථාන නිර්මිත කිරීමේදී යම් සංස්ථානයක් ස්ත්‍රීභාව රූපයෙන් යුක්තකොට නිර්මිතකරනු ලැබීනම් ඒසංස්ථානය ස්ත්‍රී ආකාරයෙනුත් යම් සංස්ථානයක් පුරුෂ භාවරූපයෙන් යුක්තකොට නිර්මිතකරනු ලැබීනම් ඒසංස්ථානය පුරුෂාකාරයෙනුත් කර්මාදිචතුර්විධ ප්‍රත්‍යයෝම දියුණු කරන්නාහුය. එහෙත් ඒප්‍රත්‍යයන්ට භාව රූපයාගේ ආඥාචක්‍රයට යටත්නොවී රූප දියුණු කිරීමට සමර්ථකමක් නැත්තේය උපමාව නම් රජදරුවෝ දෙන්නෙක් රටදෙකක රාජ්‍යානුශාසනා කෙරෙත්තම තමන් අයත් රටෙහි ගෙවල්සාදන්නන් විසින් ගෙවල් සෑදියයුතු ආකාරය (පලෑන) නියමකොට නීති දෙකක්ද පනවා තිබේ. යමෙක් ඒ නීතියට විරුඬව ගෙයක්සෑදුවේවීනම් ඔහට දඬුවම් කෙරෙත්. ඒ රජදරුවන්ගේ පලෑන්දෙකද එකකට එකක් සම නොවේ. ස්ත්‍රීසංස්ථාන පුරුෂසංස්ථාන හෙවත් ස්ත්‍රී පුරුෂ ශරීරද්වය මේ උපමාවෙහි රට දෙක හා සදෘශයි. කුඩුමහත් ශරීරාඞ්ග ප්‍රාසාදශාලා මණ්ඩපාදිය හා සදෘශයහ. කර්මාදි චතුර්විධ ප්‍රත්‍යයෝ ගෙවල්සාදන වඩුවන් හා සදෘශයහ. ස්ත්‍රී පුරුෂ සංස්ථාන දෙක ගෘහයන් හා සදෘශයහ. භාව රූප දෙක රජදරුවන් දෙදෙන හා සදෘශයහ. රජදරුවෝ ගෘහ නිර්මාණය නොකරත් ගෘහ නිර්මාණය කරන්නෝ නම් වඩුවෝය. එහෙත් ඒ වඩුවන්ට සිය අදහස් පරිදි ගෘහ නිර්මාණයට අවකාශයක් නැත්තේය රජදරුවන්ගේ ආඥාවට යටත්වම වඩුවන් විසින් ගෘහනිර්මාණය කටයුතුවේ. මේ නයින් පෘථිවි ආපො සෘතුධාතුන් ප්‍රත්‍යයකොට ගෙන වැඩෙන වෘක්ෂ ලතාවන්තුළ බීජනියාම ධාතුන්ගේද කර්ම චිත්ත සෘතු ආහාරයන් ප්‍රත්‍යයකොටගෙන වැඩෙන ගර්භසෙය්‍යකාදි සත්ත්වයන් තුළ ජන්ම නියාම ධාතුන්ගේද තෘෂ්ණා විශෙෂ කර්ම විශෙෂප්‍රත්‍යයකොට ගෙන රූප සටහනින් සහ චිත්ත ක්‍රියාවන්ගෙන් වෙනස්ව උපදින ස්ත්‍රී පුරුෂයන් තුළ භාව නියාම ධාතුන්ගේද ආධිපත්‍යය තේරුම්ගත යුතු. එහෙයින්ම ඊශ්වරාර්ථ වාචී ඉන්ද්‍රිය ශබ්දයහා සමාසකොට ස්ත්‍රී පුරුෂ භාව රූපද්වය වදෑරණ ලදී. ඒ භාව රූපද්වය වනාහි අති සූක්ෂමවේ. එහි ඵලයවූ ස්ත්‍රී පුරුෂාකාර සංස්ථානයන්ම මනුෂ්‍යයෝ ස්ත්‍රී පුරුෂයන්කොට හඳුණගන්නාහුය. භාව රූපද්වය ගැන දැනීමක් ඔවුන් තුළ නැත්තේය.

## 5. ජීවිත රූපය.

සත්ත්ව සන්තානයෙහි චිත්ත,සෘතු,ආහාරයන් ප්‍රත්‍යයකොට ගෙන පහළවන චිත්තජ සෘතුජ ආහාරජ රූප තුන්කොටස ස්වකීය ස්වකීය ජනකප්‍රත්‍යයන් විද්‍යමානකල්හිම සන්තතිවශයෙන් පහළවීමත් ස්වකීය ස්වකීය ජනකප්‍රත්‍යයන් සමඟ නිරුද්ධවීමත් ස්වභාවකොට ඇත්තේය. ලොභසහගත චිත්තය ප්‍රත්‍යයකොටගෙන පහළවනලොභසහගත චිත්තජ රූප සන්තතිය ඒ ලොභසහගත චිත්තය සමගම නිරුද්ධවෙයි. ද්වෙෂ සහගත චිත්තය ප්‍රත්‍යයකොටගෙන පහළවන ද්වෙෂ සහගත චිත්තජ රූප සන්තතිය ඒ ද්වෙෂ සහගත චිත්තය සමගම නිරුද්ධ වෙයි. මොහ සහගත චිත්තය ප්‍රත්‍යයකොට ගෙන පහළවන මොහ සහගත චිත්තජ රූප සන්තතිය ඒ මොහ සහගතචිත්තය සමගම නිරුද්ධ වෙයි. ශ්‍රද්ධා ප්‍රඥාදි සහගත චිත්තයන් ප්‍රත්‍යයකොටගෙන පහළවන ශ්‍රද්ධා ප්‍රඥාදි සහගත චිත්තජ රූපද ඒ ඒ චිත්තයන් සමගම නිරුද්ධවන්නාහුය. මෙසේ ඒ ඒ චිත්තවාරයක් ප්‍රත්‍යයකොට ගෙන පහළවන ඒ ඒ චිත්තජ රූප සන්තති ඒ ඒ චිත්තවාරය සමගම නිරුද්ධවන ආකාරය දතයුතු. මේ නයින් ඒ ඒ සෘතුන් ප්‍රත්‍යයකොටගෙන පහළවන ඒ ඒ සෘතුජ රූප සන්තති ඒ ඒ සෘතුන් සමගම නිරුද්ධවන ආකාරයද ඒ ඒ ආහාරයන් ප්‍රත්‍යයකොටගෙන පහළවන ඒ ඒ ආහාරජ රූප සන්තති ඒ ඒ ආහාරයන් සමගම නිරුද්ධවන ආකාරයද දතයුතු. මෙසේ චිත්තජ සෘතුජ ආහාරජ රූපයන්ගේ නිරොධය අති ශීඝ්‍ර හෙයින්ම 'මේ සත්ත්වයන්ට දවස දෙතුන් වේලේ ආහාර අනුභව කරන්ටද ශරීරයට අහිතවූ සෘතුගුණ ඉවතලා හිතවූ සෘතුගුණ ඇතිකරගනු පිණිස හිඳිනා, හෝනා, ගෘහාවාස සපයන්ටද අඳිනා, පොරෝනා, වස්ත්‍ර කොට්ට, මෙට්ට, ඇඳ, ඇතිරිලි නිතර සොයා පරිභොග කරන්ටද එසේම යාන වාහන වහන් සැරයටි ඡත්‍ර සොයා පරිභොගකරන්ටද සිදුවී තිබේ. කෑම් බීම් ගමන් බිමන් ඉඳුම් හිටුම් ආදි අහිත විෂම ආහාර පානවලින් විෂමක්‍රියාවලින් වෙන්ව කලට වෙලාවට සුදුසු කෑම් බීම් ඉඳුම් හිටුම් ආදිය වෙනුවෙන් මොහොතකුදු පමානොවී ජීවිතාන්තය දක්වා ව්‍යාවෘතතවන්නටද සිදුවීතිබේ. එහෙයින් යාම් සිටීම් හිඳීම් හොවීම් යන සතර ඉරියව් පවත්වන කාල වල නිරන්තරව උපදිනජවන් සිත්වලින් පහළකරනලද චිත්තජ රූපයන්ගේ සන්තති ඝට්ටණයෙන්ම සත්ත්වයන්ගේ ස්කන්ධකායයන්ට ඇද නොවැටී ධරා සිටිය හැකිවී තිබේ. ඉඳින් ඒ අතර නිද්‍රාවක් සිහිසන්නැති කමක් ඇතිවීනම් මළ

කඳක්සේ ස්කන්ධකය ඇද වැටෙන්ට පිළිවන. ගමන් යන කල නිරන්තරව උපදින ජවන් සිත් වලින් ඔසවා දමන ලදුව පාදොත්ක්ෂෙපනික්ෂෙපයෙන් ස්කන්ධකය ගමන ක්‍රියා වෙන් යුක්ත වන්නේය. ඒ පාදොත්ක්ෂෙපයන්ටත් නික්ෂෙප යන්ටත් අතරවෙන වෙනම පහළවන්නාවූ ජවන චිත්ත සන්තති උපස්ථම්භකය ඇද වැටෙන්ට නොදී කෙළින් කරඅල්වා ගන්නාහුය. මෙසේ චිත්ත ඍතු ආහාරයන් ප්‍රත්‍යයකොට ගෙන පහළවන චිත්තජාදි ත්‍රිජ රූපයන්ට ස්වකීය ජනක ප්‍රත්‍යයන්ගේ අනුපාලකත්වය හැර කර්මජ රූපයන්මෙන් අනුපාලක ජීවිතෙන්ද්‍රියක් නැති ආකාරය දතයුතු. එහෙයින් ඒ ත්‍රිජ රූප යම් කිසිවෙකු විසින් නැඟිටවූ මෘත ශරීරයක් මෙන් ස්වකීය ජනක ප්‍රත්‍යයන් විද්‍යමාන කල්හිම නැඟිට ඒ ජනකවූ ප්‍රත්‍යයන්ගේ නිරොධය සමගම නිරුද්ධවන සුලු යහ. නිරුද්ධවූ අතීත කුශලා කුශල කර්ම ප්‍රත්‍යයකොටගෙන පහළවන කර්මජරූප විනාශි ලුහු බැඳ යමින් ආරක්ෂාකරන ජනක ප්‍රත්‍යයෙන් යුක්ත රූප වර්ගයක් නොවේ. කුශලා කුශල කර්මයන් විසින් නිපදවන අවස්ථාවෙහිම ජීවිතෙන්ද්‍රිය යෙන් යුක්තකොට නිපදවනු ලබන රූපවර්ගයකි එහෙයින් ඒකර්මජ රූප සහජාත ජීවිතෙන්ද්‍රියයෙන් අතර සිඳිය නොදී සන්තතිවශයෙන් පාලනය කරනු ලබන රූපයන්බව දත යුතු. අතීතකුශලාකුශල කර්මය චිත්තාදි ප්‍රත්‍යයන්මෙන් තමා විසින් උපදවන ලද කර්මජ රූප ලුහුබැඳ යමින් කර්මජ රූප සමගම නිරුද්ධවන ප්‍රත්‍යයෙක් නොවේ. හුදෙක් ඒ කුශලා කුශලකර්මයන් විසින් ඒ රූපයම් ජීවිත රූපයකින් යුක්ත කොට නිපදවනුලැබීනම්ඒ ජීවිත රූපයෙන්ම ඒ කර්මජ රූප අතර සිඳිය නොදී සන්තතිවශයෙන් පාලනය කරනු ලබන් නාහුය. එහෙයින් කර්මජරූප ජීවිතෙන්ද්‍රිය සහිත රූපයන්බව දතයුතු. ප්‍රතිසන්ධික්ෂණයෙහි පටන් මරණය දක්වා සත්ත්ව ශරීරයෙහි පූර්වකර්මයෙන් ජනිත කර්මජ රූප ශීඝ්‍රනදී ශ්‍රොත සක් මෙන් සහජාත ජීවිතෙන්ද්‍රියයෙන් අනුපාලනය කරන ලදුවම අතර නොසිඳි සන්තති වශයෙන් පවත්නාහුය. චිත්තජාදි රූපසන්තති සම්පූර්ණයෙන්ම නිරුද්ධවී යතත් කර්මජ චක්ෂුඃප්‍රසාද රූපසන්තතිය එසේ නිරුද්ධවී නොයයි. ශ්‍රොත්‍ර, ඝ්‍රාණ, ජිව්හා, කාය ප්‍රසාද රූපසන්තති ස්ත්‍රීභාව පුරුෂභාව රූපසන්තති සහ හෘදයවස්තු රූපසන්තතිය එසේ නිරුද්ධවී නොයෙත් නිරුද්ධවීයාමක් නැත්තේ යථොක්ත ජීවිතෙන්ද්‍රිය රූපයාගේ අනුපාලනයාගේ බලයෙනි එහෙයින් මරණාස න්නකාලයෙහි අන්තිම කර්මජරූපයන්ගේ නිරොධය දක්වා

සත්ත්වසන්තානයෙහි කර්මජරූප සන්තති නිරුද්ධවීයනොදී රක්ෂාකරගෙනයන සහජාතරූප විශෙෂය ජීවිත රූපයයි කියන ලදී.

යටමහාභූත නිර්දේශයෙහි ලෞකිකමහජනයා විසින් අධාන ප්‍රවෘත්තයයි වරදවාගන්නාලද ජීවිතය සඳහා ජීවිතයක් නැතයයි කියනලදී.

## 6. හෘදය වස්තු රූපය.

හෘදය කොෂාභ්‍යන්තරයෙහි ලේධාතුව ආධාරකොට ගෙන පහළවන රූප විශෙෂය හෘදය වස්තු රූපයයි කියනලදී. කුශල විපාක අකුශල විපාක චක්ෂුර්විඥානවය චක්ෂුඃප්‍රසාද රූපයද, ශ්‍රොත්‍ර විඥානවය ශ්‍රොත්‍රප්‍රසාද රූපයද ඝ්‍රාණ විඥානවය ඝ්‍රාණප්‍රසාද රූපයද ජිව්හා විඥානවය ජිහ්වාප්‍රසාද රූපයද කායවිඥානවය කායප්‍රසාද රූපයද නිඃශ්‍රයකොටගෙන පහළවේ. එහෙයින් ඒ ප්‍රසාද රූප පඤ්චකය ධාර නාම යෙනුත් වස්තු නාමයෙනුත් වදාරනලදී. ඒ ප්‍රසාද රූප පඤ්චකය නිඃශ්‍රයකොටගෙන පහළවන කුශලාකුශල විපාක විඥාන දශය හැර කාමරූප භූමිවයෙහි පහළවන අවශෙෂ චිත්ත චෛතසික සියල්ලම හෘදය වස්තු රූපය නිඃශ්‍රයකරගෙන පහළවන බව දතයුතු. හෘදය වස්තු රූපය සමග වස්තු රූප ෂට්කයෙක් වේ. ප්‍රසාද රූප පඤ්චකය ආදාස තලයක්සේ මටසිළුටු රූපපඤ්චකයෙකි, ආදාසතලය මටසිළුටුවූවත් නිස රුවනොඅගනා වස්තුවක් වන්නාක්මෙන් ප්‍රසාද රූප පඤ්චකයද රූප ශබ්දාදි ආලම්බනච්ඡායා පතනයට තරම් මටසිළුටු කමුක් ඇතත් නිසරුවනොඅගනා වස්තුපඤ්චකයෙකි. එහෙයින් ඒ ප්‍රසාද රූප පඤ්චකය නිඃශ්‍රයකොට ඉතාදුර්වලවූ පඤ්ච විඥාන චිත්ත චෛතසිකයන් මුත් කුශලාකුශලාදි බලසම්පන්න චිත්තචෛතසික පහළවීමක් නැත්තේය. හෘදයවස්තු රූපය වනාහි මටසිළුටුනුවූයෙන් අරමුණු සෙවනැලි වැටීමක් එහි නැත්තේය. තදාශ්‍රයෙන් පහළවන භවාඞ්ග සන්තානයෙහිම අරමුණු සෙවනැලි වැටෙන්නාහුය. හෘදයවස්තු රූපය අරමුණු සෙවනැලි වැටීමට තරම් මටසිළුටු නුවූවත් එයනිඃශ්‍රයකොටගෙන ඉතා බලසම්පන්න චිත්ත චෛතසික පහළවන්නාහුය. හිමාලපර්වතය නිඃශ්‍රයකොටගෙන හටගන්නාවූ වෘක්ෂ ලතාවන්මෙනි. මෙසේ කියනලදනයින් සත්ත්වයන් තුළ ඇතිවන බල සම්පන්න චිත්තචෛතසිකයන්ට නිඃශ්‍රය වන රූප විශෙෂය හෘදය වස්තු රූපයයි දතයුතු.

2018 05 15 Paññápárami - Na Uyana Free Distribution



## 7. ආහාර රූපය.

කබලීකාර ආහාරය හෙවත් පරමාණු ධාතු ස්නේහය ආහාර රූපයයි කියන ලදී සතරමහාභූත විද්‍යමානනම් මේ පරමාණු රූප ස්නේහයද විද්‍යමානයි. ස්නේහරහිත මහාභූතය කියා එකමහාභූතයක්ද නැත්තේය. ස්නේහ මඳමහාභූතය ස්නේහාධික මහාභූතය යන වෙනසම ඇත්තේය. සදෙව්ලෝ දෙවියන් අතුරෙන් මතු මතු දෙව්ලෝ දෙවියන්ගේ ස්කන්ධකායවූ මහාභූතද ඔවුන්ගේ දිව්‍යඔජාදී උපකරණ මහාභූතද අතිශයින් සියුම් යහ. අතිශයින් ප්‍රණීතයහ. අතිශයින් ඔජාධික යහ. යට යට දෙවියන්ගේ අජ්ඣත්තබහිද්ධා මහාභූත ස්කන්ධ ඔජා සහ උපකරණ මහාභූත ස්කන්ධ ඔජා වනාහි ඖදාරික යහ මඳයහ මිනිස්ලෙව්හිද ඔජාධික අජ්ඣත්ත බහිද්ධා මහාභූත ඔජාමඳ අජ්ඣත්ත බහිද්ධා මහාභූත විද්‍යමානයහ. අනුභව කරන ආහාර පානවර්ගී අතුරෙන් වෙඩරු ගිතෙල් ආදී ආහාරපාන වර්ගයන්හි පරමාණු ධාතු ස්නේහ ඔජාව අතිශයින් සියුම්ය අතිශයින් අධිකය අතිශයින් බලවත්ය. බත් කැවිලි ආදියෙහි ඔජාව ඖදාරිකද මඳද වේ. ඔජාධික ආහාරයකින් ස්වල්පයක් අනුභවකොටද බොහෝ වේලාවක්ගත කළහැකිවේ. ශීඝ්‍රවසාගිනි නොවදී කායබලය කායශක්තියද අඩුනොවේ. ඖදාරිකවූද මඳ ඔජාවත්වූද ආහාරවර්ගී බොහෝ අනුභව කළයුතුවේ. ක්ෂුධාග්නියද ශීඝ්‍රව ඇතිවේ. කාය බලකායශක්තියද වහා අඩුවේ. එහෙයින් සත්ත්වයෝ ඔජාධික ප්‍රණීත ආහාර වර්ගී අධිකව අනුභවකොට දිරවාගත නොහි නොයෙක් රොග පීඩාවලට පැමිණෙන්නාහුය. සිරියල් සාදිලිඕගං ආදී භෛෂජ්‍ය ධාතුඔජාව ගිතෙල්ඔජාවටත් වඩා සියුම්ය ප්‍රණීතය. වෙඩිඑනු ගෙඳගම් ආදී ශෛලමයධාතු, යකඩ, තඹ, පිත්තල ආදී ලොහමය ධාතු, රජත ස්වර්ණ පාරදාදී ධාතුමය ඔජා වනාහි ප්‍රමාණයටත් වඩා සියුම්ය ප්‍රණීතය. ඒ ධාතුවර්ගී දෙස් පහකළ හැකි ක්‍රමවලින් පාකයට පමුණුවා පිරිසිදු කොටගෙන ආහාර කෘත්‍ය පිණිස යොදා ගන්ට පිළිවන්නම් ඒ අමෘත භෛෂජ්‍යයක් යයි කිය යුතු වේ. නොමැරෙන බෙහෙතයි සේයි.

## 8. පරිච්ඡේද රූපය.

රූපකලාප එකිනෙක පිරිසිඳින ආකාශය පරිච්ඡේද රූපයයි කියන ලදී. අෂ්ටක, නවක, දසක, එකාදසක, ද්වාදසක තෙරසකයන්ගේ වශයෙන් එකට පහළවන්නාවූ එක එක රූපපිණ්ඩයක් රූපකලාපයක්නම් වේ. එක අණුරේණුවකම

2018 05 15 Paññápárami - Na Uyana Free Distribution



එබඳු රූප කලාප දහසකටද අධිකයහ. එකාබද්ධවූ තිල
බීජයන්ගේ අන්තරයන් මෙන් අණුරේණුත්වයෙන් කැටිවූ
ඒ රූපකලාපයන්ටද ඒකාන්තයෙන් අන්තරාකාශ ඇත්තාහු
මය. අන්තරාකාශ ඇති හෙයින්ම පරමාණු, අණු, තජ්ජාරි,
රථරේණු, ලික්ඛා, ඌකාදි සංස්ථානත්වයෙන් කැටිව පහළ
වන්නාවූ ඒරූපකලාප මේත් එකලාපයක මේත් එක කලාප,
යක කියා වෙන්කොට දතහැකිවීතිබේ. ලීදඬු කපා පලා,
සැස, විද, වෙන් කිරීමේදී කියත්. පොරෝ, වෑ, නියන් මුවාත්
ඒ අන්තරාකාශානු සාරයෙන් ලීදඬු තුළට ප්‍රවිෂ්ට වන්නාහු
ය. අෂ්ටක, නවකාදී පරමාණු රූප කලාප වනාහි කපා, පලා,
විද, වෙන්කළහැකි නොවේ සත්වශරීරයෙහිද දුම් හුමාර ලේ
වායු වර්‍ගී යථොක්තාකාර අන්තරාකාශානුසාරයෙන් ගමනාග
මනය කරන්නාහුය එබඳු අන්තරාකාශමේ ශරීරයෙහි ඉඳි
කටු මුණතක් පොව්වන පමණද නොහැර හැමතන්හිම
ඇත්තාහුය.

## 9. විඥප්තිරූප දෙක.

විඥප්ති රහිත ශුද්ධවායො ධාතු බලයෙන් ඒ ඒ ද්‍රව්‍යයන්ගේ
සැලීම වායො ධාතුහු විසින් ගිස ලූ ලූ අතකට අනුගතව මුත්
පුද්ගලයාගේ අදහසට අනුගත නොවේ. සවිඥප්තික වායො
ධාතු බලයෙන් වන සැලීම වනාහි පුද්ගලයාගේ අදසහට
අනුගත වේ.

එහෙයින් කායවිඥප්ති රූපය නැව්පස්ස අල්වන්නෙකු හා
සදෘශවේ නැව් පස්ස අල්වන්නෙකු නැතිව පදිනු ලබන
නැවක් පුද්ගලයාගේ අදහසට නොඅනුගතවැ නැව් ගිස ලූ ලූ
අතකටම යාත්‍රා කරනසුලුය පස්ස අල්වන්නෙකු පලුපතින්
(හබලෙන්) ප්‍රතිපාදනය කරන ලදුවම පුද්ගලයාගේ අද
හසට අනුගතවැ යාත්‍රා කරන්නීය. එපරිද්දෙන් ඒ ඒ කායා
ඞ්ගවල උත්සාහ ජනකවූ ජවන් සිත් පෙලවල් ඉපදී ඒ ඒ අඟ
පසඟට වැටී තිබෙන කුඩුමහත් නහර වායො ධාත්වාධික
චිත්තජරූපකලාපයන් ගෙන් පූරවන්නාහුය. ඒ පිරවීමත්
වලාහපටලයෙන් නික්මෙන විදුලි කළඹින් මුළු අහස්කුස
ක්ෂණයකින් පූරවාලන්නාක්මෙන් ඉතා ශීඝ්‍රයි. එසේ පහළ
වනරූපකලාපයක් පංසා මුලින් මුලින් ඇතිවන කලාපප්‍රති
පාදක රූපවිකාරය ඇතිවම ඒ ඒ අඟ පසඟ සොලවාලී
මෙහිපොහොසත් චිත්තජවායො ධාතූන්විසින් පාදොත්ක්ෂෙප
නිඃක්ෂෙපාදි ක්‍රියා කරවනු ලැබේ ඒ රූපවිකාරය කායවිඥප්ති
රූපයයි කියනු ලැබේ.

වාග් විඥප්තියෙහි ශුද්ධ පෘථිවී ධාතු සට්ටනයෙන් ඇතිවන ශබ්දකලාප පුද්ගලාභිප්‍රායානුකූල අක්‍ෂරබවට වචන බවට පැමිණ ගත නොහෙත්. සවිඥප්තික චිත්තජ පෘථිවී ධාතුසට්ටනයෙන් ඇතිවනශබ්දකලාපම පුද්ගලාභිප්‍රායානුකූලව එකතුවී අක්‍ෂරබවට වචන බවට පැමිණෙන්නාහුය. මේ වාග් විඥප්ති රූපය වනාහි චිත්තජ පෘථිවී ධාත්වාධික රූපකලාප අක්‍ෂරභාවයෙන් එකතුවීම පිණිස පිළියෙළකරන හෙයින් නලාපිඹීමේදී නලාහඬ පිළියෙළ කරන හස්තවිකාරය හා මඳක් සදෘශයයි කිව හැකිවේ. අසුරු සැණක් ඇස් පියවරක් පමණ උච්චාරණයෙන් එබඳු එක අකුරක්, ඉපදවිය යුතු වේ. එසේ උපදවනු ලබන අකුරුනම් සංස්කෘත භාෂාවේ හැටියට අ, ආ, ඉ, ඊ, උ, ඌ, ඍ, ඎ, ඏ, ඐ, එ, ඓ, ඔ, ඖ, අං, අඃ. ක, ඛ, ග, ඝ, ඞ, ච, ඡ, ජ, ඣ, ඤ, ට, ඨ, ඩ, ඪ, ණ, ත, ථ, ද, ධ, න, ප, ඵ, බ, භ, ම, ය, ර, ල, ව, ශ, ෂ, ස, හ, ළ, යන මොව්හුයි. පාළිභාෂාවේ හැටියට අ, ආ, ඉ, ඊ, උ, ඌ, එ, ඔ. ක, ඛ,—පෙ—ය, ර, ල, ව, ස, හ, ළ, අං යන මොවුහුයි. සිංහල භාෂාවේ හැටියට. අ, ආ, ඉ, ඊ, උ, ඌ, එ, ඒ, ඔ, ඕ, ඇ, ඈ, ක, ග, ජ, ට, ඩ, ණ, ත, ද, න, ප, බ, ම, ය, ර, ල, ව, ස, හ, ළ, අං, යන මොව්හුයි.

උත්පත්තිස්ථාන වශයෙන් වනාහි ළය, ග්‍රීව, තල්ල, මුඳුන, දත්, තොල්, නැහැ යන සප්තස්ථානයෙහි උපදීත් කායචලනය ඇසින් දැක කාය විඥප්තිය මනොවිඥානයෙන් දැන ගනු ලැබේ. උච්චාරණ ශබ්දය කණින් අසා වාග්විඥප්තිය මනොවිඥානයෙන් දැන ගනු ලැබේ. විඥප්තිද්වය චක්‍ෂුශ්‍රොත්‍ර විඥානයන්ට අරමුණුනොවේ. සියලු සත්වයන් තුළම මේ විඥප්තිද්වය විද්‍යමාන බැවින් එකෙකුගේ අදහස අන්‍යයෙකුට කාය වාග් දෙකින් හැඟ විය හැකිවීතිබේ. කායකම්මං වචීකම්මංයි ආතන්හි චෙතනාව කර්ම නම් වේ. කාය විඥප්ති රූපය කාය නම්වේ. වාග්විඥප්තිරූපය වචීනම්වේ. කායවිඥප්ති සම්බන්ධයෙන් ඇතිවන කුශලාකුශල චෙතනා දෙකොටස කාය කර්ම වෙයි. වාග් විඥප්ති සම්බන්ධයෙන් ඇතිවන කුශලාකුශල චෙතනා දෙකොටස වාග් කර්ම වෙයි. කායවාග්දෙක රූප ධර්ම නම් කර්මය නාම ධර්ම නම් 'මනො කම්මං'යි ආතන්හි කුසල් අකුසල් සිත් දෙකොටස මනො නම් චෙතනාව කර්ම නම් විඥප්ති විරහිත ශුද්ධ කුශලාකුශල චිත්ත සහජාත චෙතනාව මනඃ කර්ම නම් එයින් කායවචී මනො යන තුන ද්වාරයෝයි කායද්වාර, වාග්ද්වාර, මනොද්වාරයි සේයි. කායාඞ්ගයකින් කළාම සම්පාදනය වන ප්‍රාණඝාතාදි කර්මරාශිය කාය විඥප්තිය ඇතිවම සම්පාදනය වන්නේයි.

2018 05 15 Paññápárami - Na Uyana Free Distribution



එහෙයින් කායවිඥප්තිය ප්‍රාණඝාතාදි කර්‍ම පැන නැගීමට මාර්‍ගවූ ද්වාරයයි කියන ලදී. වචී මනො දෙක්හිද ද්වාරභාවය මේනයින් දතයුතු. චක්‍ෂු, ශ්‍රොත්‍ර, ඝ්‍රාණ, ජිව්හා, කාය සඞ්ඛ්‍යාත පඤ්ච ප්‍රසාද ද්වාරයන් සමග මේ විඥප්තිද්වය එකතු කළ කල්හි රූපද්වාර සප්තකයෙක් වේ.

ප්‍රසාද රූප පඤ්චකය අධ්‍යාත්ම සන්තානයෙහි ඇතිවන චිත්තචෛතසිකයන්ගේ සහ බාහ්‍ය ආලම්බනයන්ගේ එකතු වීමට ස්ථානවූ හෙයින්ද විඥප්තිද්වය කායවචී කර්‍මයන්ගේ පැනනැගීමට මාර්‍ගයවූ හෙයින්ද ද්වාරයයි කියනලදී. කායවිඥප්තිය ඇතිවැම අධ්‍යාත්ම සන්තානයෙහි කාය කර්‍ම රාශියත් වාග් විඥප්තිය ඇතිවැම අධ්‍යාත්ම සන්තානයෙහි වාක්කර්‍ම රාශියත් මනඃ සඞ්ඛ්‍යාත චිත්තය ඇතිවැම අධ්‍යාත්ම සන්තානයෙහි අභිධ්‍යාදිචෛතසික මනඃ කර්‍ම රාශියත් සම්පාදනය වන්නේයි. දොර ජනෙල් කවුළු ඇති කල්හිම චන්ද්‍රසූර්‍ය්‍යයන්ගේ ආලොකය සහ සුළඟ ගෘහයතුළ ඇතිවන්නාක්මෙන් සත්ත්වයා තුළද කායවාග්මනඃ සඞ්ඛ්‍යාතද්වාරත්‍රය ඇති කල්හිම කාය වාග්මනඃ කර්‍මත්‍රය ඇතිවන්නේයයි දතයුතු.

## 10 විකාර රූපතුන.

සත්ත්වයන්ගේ ස්කන්ධ කායෙහි මහාභූත ධාතු සතර ව්‍යපශාන්තවූ පවත්නාකල කායලඝුතා, කායමුදුතා, කාය කම්මඤ්ඤතා සඞ්ඛ්‍යාත විකාර රූපත්‍රය ඇතිවේ. මුළු ශරීරයෙහි හෝ ශරීරෙක ප්‍රදේශයෙක්හි කාෂ්ඨමුඛ සර්ප පෘථිවි ධාතුව හෝ පූතිමුඛසර්ප ආපො ධාතුව හෝ උත්සන්නවූ අකල්හි නැගිටින්ට ඒ මේ අත පෙරළෙන්ට බැරිතරම් ශරීරයෙහි බරගතියක් ඇතිකෙරේ. එකල ශරීරයෙහි ලඝුතා රූපය නිරුද්ධවූයේ වේ. ඖෂධ සෙවනයෙන් ඒ බරගතියට කාරණවූ අධික පෘථිවිආපො ධාතූන් ව්‍යපශමණයට පමුණුවාගත් කල්හිමනැවත නැගිටීම ඒ මේ අත පෙරළීම පහසුවීමෙන් ශරීරයෙහි ඒ ලඝුතා රූපය ඇතිවන්නේය. මේ නයින් කාෂ්ඨමුඛ සර්ප පෘථිවි අධික කායාඞ්ග ශස්ත්‍රමුඛසර්පවායොඅධික කායාඞ්ගස්තබ්ධවීමෙන් රූපයන්ගේ මොලොක්කමයයි කියනලද කාය මුදුතා රූපය නැතිවන සැටි සහ ඖෂධ සෙවනයෙන් ඒ අධික පෘථිවි වායො ධාතූන් ව්‍යපශමණයට පමුණුවා ගත් කල්හිම ඒ කාය මුදුතා රූපය නැවත ඇති වන සැටිද දතයුතු.

කාෂ්ඨමුඛ සර්ප පෘථිවි, පූතිමුඛ සර්ප ආපො, අග්නිමුඛ සර්ප තෙජො, ශස්ත්‍ර මුඛ සර්ප වායො යන සතර මහාභූත ධාතූන් ව්‍යපශමණයට නොපැමිණි කායාඞ්ගයන්හි කර්‍මක්‍ෂමතා

සඞ්ඝාත කායකර්මණ්‍යතා රූපය ඇති නොවේ. ඖෂධ සෙවනයෙන් සතර මහාභූතධාතූන් ව්‍යපශමණයට පමුණුවා ගත්කල්හිම නැවත ඒ කර්මණ්‍යතා රූපය ඇතිවේ.

යථොක්ත ලඝුතා මුදුතා කම්මඤ්ඤතා රූපතුනද මහාජනයාට ප්‍රකට රූප තුනකි. කෑම්, බීම්, ඉඳුම්, හිටුම්, ආදියෙහි සුපරීක්ෂා කාරිත්වය ඒ රූපතුන වෙනුවෙන් ඇතිවී තිබේ ඒ එසේමය කාෂ්ඨ, පූති, අග්නි, ශස්ත්‍ර මුඛ වශයෙන් සර්පයෝ සතර දෙනෙක. එයින් කාෂ්ඨ මුඛ සර්පවිෂ විහිද ගිය සත්වයා පෘථිවි ධාතුව උත්සන්නව දරදඬුවී මරුමුවට පැමිණෙයි මරණින් පසුද ශරීරය දරකඩක්සේ ස්තබ්ධවන්නේයි. පූති මුඛ සර්පවිෂ විහිද ගියසත්වයා ස්කන්ධකාය ආපොඋත්සන්නව දියාරුවී ක්ෂණයකින් මරුමුවට පැමිණෙයි මරණින් පසුද ශරීරය ජුහුජුහුව කුණුවීයන්නේයි. අග්නි මුඛ සර්ප විෂ විහිදගිය සත්වයා ඇස්වලින් ගිනිගෙන දැල්වී ක්ෂණයකින් මරුමුවට පැමිණෙයි. මරණින් පසුද ශරීරය ජුහුජුහුව වියලීයන්නේයි, ශස්ත්‍ර මුඛ සර්පවිෂ විහිදගිය සත්වයා වායො උත්සන්නව ක්ෂණයකින් සන්ධිපූරුක් ගැලවී මරුමුවට පැමිණෙයි, මරණින් පසුද ශරීරය ජුහුජුහුව සන්ධි පූරුක් ගැලවී විසිරයන්නේයි. ස්කන්ධලොකයෙහි සර්පයෝ සතර දෙනෙක එයින් පෘථිවිධාතුව කාෂ්ඨ මුඛ සර්පනම්. ආපො ධාතුව පූති මුඛ සර්ප නම්. තෙජො ධාතුව අග්නි මුඛ සර්ප නම් වායො ධාතුව ශස්ත්‍ර මුඛ සර්පනම්.

ඒ සර්පයන් සතරදෙන අතුරෙන් යම් සර්පයෙක් යම් කායාඞ්ගයක විෂම ගතිකවීද ඒ කායාඞ්ගයෙහි විකාර රූපතුන අතුරුදන්වන්නාහුය. සෑහෙන ප්‍රතිසංස්කරණයකින් ප්‍රතිසංස්කරණයට පැමිණවූ කල්හිම ඒ කායාඞ්ගයෙහි නැවත ඒ විකාර රූප පහළවන්නාහුය. එසේ විකාර රූප පහළවන්ට පටන්ගත් කල්හිම ඒ ඒ කායඞ්ගා චලනයෙහි සුවපහසු ලැබියහැකි වන්නේය. ඒ විකාර රූප තුන පූර්ව කර්මයෙන් ඇතිවනරූපයෝ නොවෙත් ඒ ඒ චිත්ත ඍතු ආහාරයන්ට අනුකූලව ඇතිවීමට අවකාශ එළඹ සිටි කල්හිම චිත්තජව ඍතුජව ආහාරජව අවස්ථාවශයෙන් ඇතිවන රූපයෝයහ. විකාරරූපතුන නිමි.

ශුබ චිත්තජ විඥප්තිවයද විකාර රූපයන්බැවින් කියනලද විකාර රූපත්‍රයට එකතුකල කල්හි විකාර රූප පඤ්චකයෙක් වේ. මහාභූතයන්ගේ ආකාර මාත්‍රයන්ව විකාර රූපයයි කිය

නලදහ. මේ විකාර රූපසාමාන්‍ය මනුෂ්‍යයන්ටද ප්‍රකටයහ. එහෙත්ධාතු විශෙෂ ධර්‍ම විශෙෂයන් බව නොදත් හෙයින් ඔව්හු ඒ විකාර රූපයන් මමයමාගේයයි හගින්නාහුය.

උපචය, සන්තති, ජරතා, අනිච්චතා යන සතර ලක්ෂණ රූප සතරයයි කියන ලදහ. ප්‍රථමකොට පහලවීම වැඩීම උපචය නම්. පරම්පරාවට පහලවීම වැඩීම සන්තතිනම්. ඒ උපචයසන්තතිවය එක්කොට ගෙන ජාති රූපයයි කියන ලදී. දිරීම ජරතා නම්. බිඳී අතුරුදන්වීම අනිත්‍යතා නම්. භඞ්ගය මරණය යනුද අනිත්‍යතාවට නම්. කර්‍මජ, චිත්තජ, ඍතුජ, ආහාරජ රූප සතර කොටසෙහිම ලක්ෂණ රූප සතර විද්‍යමානයහ. නිෂ්පන්න රූප සම්පූර්‍ණවීම දක්වා පහලවීම වැඩීම උපචයනම්. පරම්පරාවට පහලවීම වැඩීම සන්තතිනම්. පැසීම, මුහුකිරීම, පරණව මැලවීම, දිරා මහලුවීම, පිරිහීම ජරතා නම්. බිඳී අතුරු දන්වීම අනිත්‍යතානම්යි සේයි.

අඹ දඹ කොස් දෙල් ලබු පුසුල් ආදි වෘක්ෂ ලතාවන්හි පල තරු ඇදුණු තැන් පටන් ක්ෂණයෙන් ක්ෂණය පහලවීම වැඩීම උපචයනම්. වැඩී කෙලවරවූ තැන් පටන් රූප කලාපයන් පරම්පරාවට පහලවීම වැඩීම සන්තතිනම්. පහලවෙමින් වැඩෙමින් පවත්නා නිෂ්පන්නරූපයන්ගේ උත්පාදය උපචයනම්. වැඩී කෙලවරවූ තැන් පටන් නදී ශ්‍රොත සක්මෙන් පරම්පරාවට පවත්නා උත්පාදය සන්තති නම්යි සේයි.

කර්‍මජරූපයන් තුල ප්‍රතිසන්ධි කාලයෙහි පටන් ඒ කර්‍මජරූප සම්පූර්‍ණවනතුරු අලුතෙන් අලුතෙන් පහලවීම වැඩීම ඇත්තේය. වැඩී කෙලවරවූ පසු වැඩුණු පරිද්දෙන් පරම්පරාවට පහලවෙමින් වැඩෙමින් පැවැත්ම මුත් අලුතෙන් අලුතෙන් පහලවීමක් වැඩීමක් නැත්තේය. අලුතෙන් අලුතෙන් පහලවීම වැඩීම ඇතිතාක් උපචයට ක්ෂෙත්‍රයි. වැඩීකෙලවරවූ පසු වැඩුණු පරිද්දෙන් පරම්පරාවට පහලවෙමින් වැඩෙමින් පැවැත්ම සන්තතියට ක්ෂෙත්‍රයි.

චිත්තජ රූපයන් තුල වනාහි ඒ ඒ ඡන්දාභිප්‍රායයන්ගේ වශයෙන් උත්සාහවත්වූ ඒ ඒ චිත්තයන්ගෙන් යෑම් ඊම් ඉඳුම් හිටුම් අඟ පසඟ සෙලවීම් කථා බස්කිරීම් ආදි කායික වාචසික ක්‍රියා පවත්වන කල්හිද ඒ ඒ රූප විශෙෂ ජනක ලොභ ද්වෙෂාදි චෛතසික ක්‍රියා විශෙෂ පවත්වන කල්හිද චිත්තජ රූපයන්ගේ නැගීම් ඉදිරීම් සෙලවීම්වල ආදි මධ්‍යපරියො

සානා ඇතිවීම ධර්මතායි. එහි ආදියෙහි පටන් වැඩී කෙළවරවීම දක්වා උපචයට ක්ෂෙත්‍රයි. වැඩී කෙළවරවූ තැන් පටන් ඒ ඒ සන්තතීන්ගේ අනන්තර්ධානය දක්වා පරම්පරාවශයෙන් පැවැත්ම සන්තතියට ක්ෂෙත්‍රයි. මේ නයින් සෘතුජ, ආහාරජ රූපයන්හිද ඒ ඒ සෘතුජ ඒ ඒ ආහාරජ රූප පිරිසිඳ පිරිසිඳ උපචය සන්තති ක්ෂෙත්‍රද්වය බෙදාගතයුතු.

චිත්තජ රූපයන්හි වරක් ඇස්පිය හෙළීමෙහි අකුරක් උච්චාරණයෙහි වරක් ආශ්වාස කිරීමෙහි පවා පළමුකොට පහළවීම වැඩීම සන්තති වශයෙන් පහළවීම වැඩීම සහ අතුරුදන්වීම විද්‍යමානයි අඟපසඟසලා යෑම් ඊම් ඉඳුම් හිටුම් පැවැත්වීමෙහි වනාහි කියනුම කවරේද?

සෘතුජ රූපයන් තුළ අඞ්ග ප්‍රත්‍යඞ්ගයන්හි උණුසුම් සිසිල් දූවිම් කැක්කුම් හිරි කොර මර වෙහෙස විඩා සුවපහස් පෙරළෙමින් පවත්නා ආකාරයද ආහාරජ රූපයන් තුළ උදෑසන අනුභව කරනලද ආහාරය ප්‍රත්‍යයකොටගෙන නගින උදෑසන රූපයන් ගේ සහ සවස අනුභව කරන ලද ආහාරය ප්‍රත්‍යයකොට ගෙන නගින සවස රූපයන්ගේ වැඩෙන පිරිහෙන ආකාරයද පරීක්ෂාකර බලා උපචය සන්තතික්ෂෙත්‍රද්වය බෙදා ගතයුතු.

මේ සත්ත්වයෝ ස්වකීය ස්කන්ධකයෙහි අනිෂ්ටරූපයන් පහළවීමවැඩීම සන්තති වශයෙන් පැවත්මයයි කියනලද උපචය සන්තති ලක්ෂණ දැන ස්කන්ධකය පරිහරණයකර ගෙනයන්නාහුය. දිරා පිරිහෙන බිඳී නටබුන් වන අයුරුද දැනගන්නාහුය. උපචය සන්තති ජරතා අනිච්චතා රූප සතර සූක්ෂ්මාකාරයෙන් දක්ක පුද්ගලයාහට සියලු රූපයෝම අනිත්‍යයහ, දුඃඛයහ, අනාත්මයහයි ප්‍රත්‍යක්ෂවන්නේයි. එසේ ප්‍රත්‍යක්ෂවීමට කරුණුවන හෙයින්ම ඊට ලක්ෂණ රූපයයි ව්‍යවහාර කරනලදී.

ලෝකයෙහි සවිඥානක අවිඥානක වස්තූන් තුළ ක්ෂණයෙන් ක්ෂණය පැයින් පැය දවසින් දවස රූපයන්ගේ පහළවීම වැඩීම, පරම්පරාවශයෙන් පැවැත්ම, පිරිහී යාම, බිඳී අතුරුදන්වීම, යන ලක්ෂණ සතර සියලු මනුෂ්‍යයෝම දන්නාහුය. ඒ එසේමය පහළවෙයි වැඩෙයි කියාද නොවැඩී නොඅඩුවී සිටියි පිහිටා සිටියි දිගාකල් පවතියි ක්ෂණයක් පවතියි කියාද පිරිහෙයි බසියි නැතිවෙයි බිඳෙයි අතුරුදන්වෙයි සංසිඳෙයි කියාද ව්‍යවහාරකරනු ලබන්නේ මේ ලක්ෂණ රූප චතුෂ්කයයි.

ලොකයෙහි ඇතිවීමට හෝ නැතිවීමටද වැඩීමට හෝ නොවැඩීමටද දිගාකල් පැවැතිමට හෝ දිගා කල් නොපැවැතිමටද පිරිහීමට හෝ නොපිරිහීමටද අතුරුදන්වීමට හෝ නොඅතුරුදන්වීමටද වෑයම් කරන්නේ මේ ලක්‍ෂණ රූපයන් සතර දෙනා වෙනුවෙනි. අතිශයින් සියුම් රූපයන් බැවින් නැවත නැවත මතුකරකර කීවෙමු.

---

## සමුට්ඨාන වශයෙන් විභාග.

රූප ජනකප්‍රත්‍යයෝ කර්‍මය, චිත්තය, සෘතුව, ආහාරයයි 4 රෙක. පූර්‍ව පූර්‍ව භවයන්හි කායාදිවාරත්‍රයෙහි පැවති සුචරිත දුශ්චරිත දෙකොටස මෙහි කර්‍මයයි කියනලදී. "චෙතනාහං භික්ඛවෙ කම්මං වදාමි"යි වදාළ පරිද්දෙන් කුශලාකුශල චෙතනා දෙකොටසයි සේයි.

දුන් ඉපදෙමින් පවත්නා චිත්ත පරම්පරාව චිත්තයයි කියන ලදී ඒ චිත්තය සහජාත චෛතසිකයන් සමග එක්ව රූප උපදවන්නේවේ.

සෘතුවනම් ශීතොෂ්ණ තෙජෝ ධාතුවයයි.

ආහාරයනම් ඔජාව හෙවත් මහා භූත ධාතුසෞභයයි.

ප්‍රසාදරූප 5, ජීවිතරූප 1, හෘදය වස්තු රූප 1, ස්ත්‍රීභාව පුම්භාව රූප 2, යන 9 නවදෙන ශුද්ධ පූර්‍ව කර්‍මයෙන්ම හට ගන්නා හෙයින් කර්‍මජඑකාංසිකනම්වෙත්.

කායවාග් විඥප්ති රූපවය ශුද්ධ චිත්තයෙන්ම හටගන්නා හෙයින් චිත්තජ එකාංසික නම් වේ.

ශබ්දය චිත්තයෙනුත් සෘතුවෙනුත් හටගන්නා හෙයින් ද්විජ රූපය නම්වේ. ලඝුතා මුදුතා කම්මඤ්ඤතාත්‍රය චිත්තයෙනුත් සෘතුවෙනුත් ආහාරයෙනුත් හටගන්නා හෙයින් ත්‍රිජ රූප නම්වේ.

මහාභූත 4, වර්‍ණ, ගන්ධ, රස, ඔජා 4, ආකාශ ධාතුව යන නවදෙන 9 කර්‍මයෙනුත් චිත්තයෙනුත් සෘතුවෙනුත් ආහාර යෙනුත් හටගන්නා හෙයින් චතුජ රූප නම්වෙත්.

ලක්‍ෂණ රූප 4 කිසි ප්‍රත්‍යයකින් හට නොගන්නා බව අභි ධර්‍මාර්‍ථ සංග්‍රහයෙහි කියන ලදී.

පාලියෙහි වනාහි උපචය සන්තතිවය චතුසමුට්ඨානික කොට වදාරනලදී. ජරතා අනිච්චතාදෙක පමණක් පිරිහීම් අතුරුදන්වීම් මාත්‍රවැ ජාති නාමයෙන් ව්‍යවහාරයට යොග්‍ය නොවූයෙන් නොවදාරන ලදහ. ශබ්දය චිත්තජය සෘතුජ යයි ද්විධවේ. ලඝුතාදිත්‍රය චිත්තජය, සෘතුජය, ආහාරජයයි

ත්‍රිවිධවේ. ආකාශ ධාතුව හා අවිනිර්‍භොගරූපාෂ්ටකය යන නවදෙන 9 කර්‍මජය, චිත්තජය, ඍතුජය, ආහාරජයයි චතුර් විධවෙත්. එකාංසික නවය 9 අනෙකාංසික නවය 9 එකතුවී කර්‍මරූප 18 ක්‍ද, එකාංසික 2 අනෙකාංසික 13 එකතුවී චිත්තජ රූප 15 ක්‍ද වේ.

ඍතුජරූප අනෙකාංසික 13 කා. ආහාරජරූප අනෙකාංසික 12 කා. මේ දෙකොටසෙහි එකාංසික නැත්තේය. මේ සියලුම රූප අවයව හෙයින් 58 ක්‍ද සංක්‍ෂෙපයෙන් 24 ක්‍ද වේ.

---

## කලාප වශයෙන් විභාග.

මහාභූත 4, වර්‍ණ, ගන්‍ධ, රස, ඔජ 4 යනමේ අෂ්ටකය එකට ඉපද එකට නිරුධවී යන රූප පිණ්ඩව බෙද, වෙන් නොකට හැකි හෙයින් අවිනිර්‍භොගාෂ්ටකයයි කියන ලදි. ඒ අෂ්ටකය කඳ (අඩිතාලම) කොට ගෙන ඊට ජීවිත රූපය එකතුකරනු ජීවිත නවක කලාපනම්වෙයි 1. ඒ ජීවිත නවක කලාපයට පඤ්ච ප්‍රසාද හෘදය වස්තු ස්ත්‍රීභාවපුම්භාව රූපයන්ගෙන් එක එක එකතු කරනු චක්‍ෂුදශක කලාපනම්වෙයි1. ශ්‍රොත්‍ර දශක කලාප නම්වෙයි 1. ඝ්‍රාණ දශක කලාප නම්වෙයි 1. ජිව්හාද ශක කලාප නම්වෙයි 1. කාය දශක කලාප නම්වෙයි 1. වස්තු දශක කලාප නම්වෙයි 1. ස්ත්‍රීභාව දශකකලාප නම් වෙයි 1 පුම්භාව දශක කලාප නම්වෙයි 1. කර්‍මජකලාප නවය නිමි.

චිත්තජ අවිනිර්‍භොගාෂ්ටකය චිත්තජ ශුද්‍ධාෂ්ටක කලාප නම් වෙයි 1. ඊට චිත්තජ ශබ්දය එකතු කරනු ශබ්දනවක කලාප නම්වෙයි 1. කායවිඥප්ති රූපය එකතු කරනු කායවිඥප්ති නවකකලාපනම්වෙයි 1. ශබ්දනවකකලාපයට වාග්විඥප්ති රූපයඑකතු කරනු ශබ්දවාග් විඥප්ති දශක කලාපනම් වෙයි 1. මේ මූල කලාප 4 යි.

මේ සතරට පිළිවෙලින් චිත්තජ ලඝුතාදිත්‍රය එකතුකරනු. ලඝුතාදි එකාදශක කලාප නම්වෙයි 1. ශබ්ද ලඝුතාදි වාද ශක කලාප නම්වෙයි 1. කාය විඥප්ති ලඝුතාදි වාදශක කලාප නම් වෙයි 1 ශබ්දවාග් විඥප්ති ලඝුතාදි තෙරසක කලාපනම්වෙයි 1. මේ සමහව කලාප 4 යි. චිත්තජකලාප අට නිමි.

ඍතුජ අවිනිර්‍භොගාෂ්ටකය ඍතුජ ශුද්‍ධාෂ්ටක කලාපනම් වෙයි1. ඊට ශබ්දය එකතු කරනු ශබ්ද නවක කලාපනම්වෙයි 1. මේ දෙකට පිළිවෙළින් ඍතුජ ලඝුතාදිත්‍රය එකතු කරනු

ලඝුතාදි එකාදශක කලාප නම්වෙයි 1. ශබ්ද ලඝුතාදි ද්වාදශක කලාප නම්වෙයි 1. සෘතුජකලාප සතර නිමි.

ආහාරජ අවිනිර්භොගාෂ්ටකය ආහාරජ ශුද්ධාෂ්ටක කලාප නම්වෙයි 1. ඊට ආහාරජ ලඝුතාදිත්‍රය එකතුකරනු ලඝුතාදි එකාදශක කලාපනම්වෙයි 1. ආහාරජ කලාපදෙක නිමි.

කර්මජ කලාප 9,චිත්තජ කලාප 8, සෘතුජ කලාප 4,ආහාරජ කලාප 2 එකතු කරනු චතුසමුට්ඨානික රූප කලාප 23 වන්නේය. ශබ්ද නවක කලාපයත් ශබ්දලඝුතාදි ද්වාදශක කලාපයත් අභිධර්මාර්ථ සඞ්ගහයෙහි නො ආ නමුත් අටුවාවල ඇවිත් තිබෙන හෙයින් ඒ දෙකත් ගෙන අපි මෙහි චිත්තජ කලාප 8ක් දක්වීමු.ආකාශධාතුවයයි කියන ලද්දේ ඒ ඒකලාපයන්ගේ අන්තරාකාශ මාත්‍රයයි එහෙයින් ඒ ආකාශ ධාතුව කලාප යොජනාවට ඇතුළත් නොකරන ලදි. ලක්ෂණ රූප 4 ද සියලුම කලාපයන්ගේ පළමුකොට පහළවීම්, සන්තති වශයෙන් පහළවීම්, මුහුකුරීම්, බිඳී නටබුන්වීම් මාත්‍රයන්වැ කලාප පිරවීමෙහි අපොහොසත් හෙයින් කලාප යොජනාවට ඇතුළත් නොකරන ලදහ.

අවිඥානක සන්තානයන්හි සෘතුජ අෂ්ටක නවක කලාප දෙකද සවිඥානක සන්තානයන්හි සියලු කලාප තෙවිස්සමද ලැබෙත්.එසින් කර්මජකලාප නියමයෙන්මත් චිත්තජ,සෘතුජ, ආහාරජ කලාප ඔවුන්ගේ වකවානු පැමිණිකල්හිත් ලැබෙන බව දතයුතු.

යට විස්තර කරනලද පරිද්දෙන් ශබ්ද විඥප්ති විකාර රූපයන්ගේ ලක්ෂණ අවබොධවූ තැනැත්තාට චිත්තජාදි රූප කලාප ඔවුන්ගේ වකවානු පැමිණි කල්හිම පහළවන ආකාරය පහසුවෙන් පෙනී යනවා ඇත. බ්‍රහ්මයන්ට ඝ්‍රාණ, ජිව්හා, කාය, ස්ත්‍රීභාව, පුම්භාව දශක 5 ද ආහාරජ කලාප 2ද යන කලාප 7 නොලැබෙත්.

---

## ප්‍රතිසන්ධිච්‍යුති වශයෙන් ප්‍රවෘත්ති නිවෘත්ති ක්‍රමය මෙසේයි.

අණ්ඩජය, ජලාබුජය, සංසෙදජය, ඖපපාතිකයයි ප්‍රතිසන්ධි 4 කා. අණ්ඩයෙහි පිළිසිඳගන්නා කාක කුක්කුටාදි සත්ත්වයන්ගේ ප්‍රතිසන්ධිය අණ්ඩජ ප්‍රතිසන්ධිය නම්වේ.ගර්භාශයෙහි(වැදෑමසෙහි)පිළිසිඳගන්නා මනුෂ්‍ය ගොමහිෂාදිසත්ත්වයන්ගේ ප්‍රතිසන්ධිය ජලාබුජ ප්‍රතිසන්ධිය නම්වේ.ගවරවල ආදියෙහි අසම්පූර්ණව පිළිසිඳගෙන ක්‍රමයෙන් දියුණුවන්නාවූ ක්‍රිමි ආදී සත්ත්ව

යන්ගේ ප්‍රතිසන්‍ධිය සංසෙදජ ප්‍රතිසන්‍ධිය නම්වේ. ප්‍රතිසන්‍ධි කාලයෙහිම සම්පූර්‍ණ ඉන්‍ද්‍රියන්ගෙන් යුක්තව පිළිසිඳගන්නාවූ දෙව බ්‍රහ්ම නෙරයිකාදි සත්ත්වයන්ගේ ප්‍රති සන්‍ධිය ඔපපාතික ප්‍රති සන්‍ධිය නම්වේ. අණ්ඩජ ජලාබුජ ප්‍රතිසන්‍ධිවය ගබ්භසෙය්‍යකයයිද කියනු ලැබේ. ඒ දෙකින් පිළි සිඳ ගන්නාවූ සත්ත්වයන්ට ප්‍රතිසන්‍ධි කාලයෙහි ස්ත්‍රී ප්‍රතිසන්‍ධියක් නම් කාය දශක ස්ත්‍රීභාව දශකවස්තු දශකත්‍රයද පූරුෂ ප්‍රතිසන්‍ධියක් නම් කායදශක පුරුෂභාව දශක වස්තු දශකත්‍රයද ලැබේ. සංසෙදජ ඔපපාතික ප්‍රතිසන්‍ධිදෙකින් පිළිසිඳගන්නාවූ සත්ත්වයන්ට ජීවිත නවක කලාපය හැර ප්‍රතිසන්‍ධි කාලයෙහි චක්‍ෂු, ශ්‍රොත්‍ර ඝ්‍රාණ, ජිව්හා, කාය, භාව, වස්තු දශක සඞ්ඛ්‍යාත දශක 7 ලැබෙත්. ප්‍රතිසන්‍ධිචිත්තයාගේ උත්පාද ක්‍ෂණය ප්‍රතිසන්‍ධිකාලයයිද ස්ථිතික්‍ෂණය පටන් මතුකාලය ප්‍රවෘත්තිකාලයයිද දතයුතු. ඒ ප්‍රතිසන්‍ධි චිත්තයාගේ ස්ථිති ක්‍ෂණය පටන් ඍතුජ කලාපද ප්‍රතිසන්‍ධි චිත්තයෙන් මතු ප්‍රථම භවාඞ්ගචිත්තයාගේ උත්පාදක්‍ෂණය පටන් චිත්තජ කලාපද ආහාර වැළඳූ තැන් පටන් ආහාරජ කලාපද ලැබෙත්.

මරණකාලයෙහි කර්‍මජරූපච්‍යුති චිත්තයසමගද චිත්තජ ආහාරජ රූපදෙකොටස ච්‍යුති චිත්තයෙන් මතු ස්වල්පවේලාවක් සිටද නිරුද්ධවන්නාහුය. ඍතුජ රූපවනාහි මෘතකලෙවර (මළසිරුරු) බවට පැමිණි පසුද උපදෙමින් නිරුද්ධවෙමින් සන්තති ඝට්ටණයට පැමිණෙන්නාහුය.

---

සිරිධම්මාභිධානෙන විසුද්ධාරාමවාසිනා,
ථෙරෙනාධුනිකාභ්‍යාය කතායං රූපවණ්ණනා.

## සංක්‍ෂෙප රූප සංග්‍රහ වර්‍ණනාව නිමි.

නිබ්බාන පච්චයො හොතු.